# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

අංක 14,936 — 1970 දෙසැම්බර් 11 වැනි සිකුරාද — 1970.12.11

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස: (I) වැනි ඡේදය—සාමාන්‍ය

(වෙන වෙනම ගොනුකර ගතහැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)


| | පිට |
|---|---|
| අග්‍රාණ්ඩුකාරතුමාණන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය | — |
| අග්‍රාණ්ඩුකාරතුමාණන් කරන පත් කිරීම් ආදිය | 927 |
| රාජ්‍ය සේවා කොමිෂන් සභාවෙන් කරන පත් කිරීම් ආදිය | — |
| අධිකරණ සේවා කොමිෂන් සභාවෙන් කරණ පත් කිරීම් ආදිය | 928 |
| වෙනත් පත් කිරීම් ආදිය | — |
| රෙජිස්ට්‍රාර්වරුන්ගේ පත් කිරීම් ආදිය | — |
| ආණ්ඩුවේ නිවේදන | 929 |
| මිළ පාලන දැන්වීම් | — |
| ශ්‍රී ලංකා මහ බැංකුවේ දැන්වීම් | — |
| ආදයම් හා වියදම් පිළිබඳ වාර්තා | — |
| ආණ්ඩුවේ වත්කම් හා බැරකම් ප්‍රකාශ | — |
| විවිධ දෙපාර්තමේන්තු දැන්වීම් | 935 |
| ''සුරාබදු ආඥපනත'' පිළිබඳ දැන්වීම් | — |


## අග්‍රාණ්ඩුකාරතුමාණන් කරන පත් කිරීම් ආදිය

1970 අංක 404

අංකය : සී 88/ආර්ඊ. සීඊ.

රාජකීය ලංකා ගුවන් හමුදව—අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේ විසින් අනුමත කරන ලද විශ්‍රාම ගැනීමක්

පහත නම සඳහන් නිලධාරියා 1971 ජනවාරි මස 1 දින සිට රාජකීය ලංකා ගුවන් හමුදවෙන් විශ්‍රාම ගනු ඇත.

එයාර් වයිස් මාෂල් ඒකනායක රොහාන් අමරසේකර, ඩී.එෆ්.සී.

(01002) පොදු රාජකාරී/නියමු.

උතුමාණන් වහන්සේගේ අණපරිදි,

ජී. ආර්. රත්නවේල්,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ
ස්ථිර ලේකම්.

1970 දෙසැම්බර් මස 3 දින,
කොළඹ දීය.

12–417

---

**සතිපතා නිකුත්වන ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා එවනු ලබන දැන්වීම් පිළිබඳ**

**විශේෂ නිවේදනයයි**

**ඉදිරියට පළවන සාමාන්‍ය සතිපතා ගැසට් පත්‍රවල පළකිරීම සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති විසින් දැන්වීම් බාරගන්නා අන්තිම වේලාවන් සහ පළකිරීමේ දින දක්වෙන, මෙම ගැසට් පත්‍රයේ සෑම කොටසකම කෙළවරෙහි පළකර ඇති විශේෂ නිවේදනය කෙරෙහි සියළුදෙනාගේ අවධානය යොමු කෙරේ. යථොක්ත නිවේදනයේ සඳහන් නියමිත වේලාවන්ට පසුව මෙහි ලැබෙන සියළුම දැන්වීම් ඒවා එවන ලද අය වෙත ආපසු එවනු ලැබේ.**

1970 ජූනි 2 වැනි දින,
ලංකාණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ.

එල්. ඩබ්ලිව්. පී. පීරිස්,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

---

## අධිකරණ සේවා කොමිෂන් සභාවෙන් කරන පත් කිරීම් ආදිය

1970 අංක 405

අධිකරණ සේවා කොමිෂන් සභාවෙන් පහත සඳහන් පත් කිරීම් කර ඇත :—

අංකය : ජේඑම්/ජී. 40/66.

එම්. පී. විජේසිංහ මහතා 1970 නොවැම්බර් මස 29 වන දින සිට කේ. සී. ඊ. ද අල්විස් මහතා නැවත වැඩ බාරගන්නා තුරු, අධිසංඛ්‍යා නිලධාරියෙකු වශයෙන් සහ කෑගල්ලේ දිස්ත්‍රික් නඩුකාර තැන, රික්වෙස්ට් කොමසාරිස් තැන සහ අතිරේක මහෙස්ත්‍රාත් තැන වශයෙන් වැඩ බැලීමට.

අංකය : ජේඒඒ. 47/48 (III).

එම්. එම්. අබ්දුල් කාදර් මහතා ඔහුගේ වෙනත් රාජකාරිවලට අතිරේක වශයෙන්, 1970 නොවැම්බර් මස 29 දින සිට පානදුර දි. උ. අංක 9976, 11950, 11525, 11514 සහ 11472 දරණ නඩු ඇසීමට සහ අසා අවසාන කර තීන්දු දීම පිණිස පානදුරේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන සහ අතිරේක මහෙස්ත්‍රාත් තැන වශයෙන්.

අංකය : ජේඑල්/ඩබ්ලිව්. 15/69.

එල්. එච්. ජී. වීරසේකර මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, ආර්. වික්‍රමසිංහ මහතා 1970 දෙසැම්බර් 2, 6 සහ 7 දිනයන්හි ගාල්ලේ අතිරේක මහෙස්ත්‍රාත් තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන, අතිරේක නාගරික මහෙස්ත්‍රාත් තැන, අතිරේක ළමා මහෙස්ත්‍රාත් තැන සහ අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන වශයෙන්.

අංකය : ජේඑල්/සී. 17/55.

එන්. දේවේන්ද්‍ර මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, ඒ. සිවගුරුනාදන් මහතා 1970 නොවැම්බර් මස 26 දින කොළඹ අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන සහ අතිරේක මහෙස්ත්‍රාත් තැන වශයෙන්.

අංකය : ජේඑල්/ටී. 8/66.

සී. එම්. තර්මලිංගම් මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, ටී. ආසිර්වාදම් මහතා 1970 දෙසැම්බර් මස 2 සිට 4 දින දක්වා රත්නපුර අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන, අතිරේක මහෙස්ත්‍රාත් තැන වශයෙන්.

අංකය : ජේඑල්/ජේ. 11/61.

එම්. ජමීල් මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, ඩබ්ලිව්. ඊ. පෙරේරා මහතා 1970 දෙසැම්බර් මස 2 දින ගම්පහ අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන සහ අතිරේක මහෙස්ත්‍රාත් තැන වශයෙන්.

අංකය : ජේඑල්/එස්. 26/61.

ජේ. සේනාතිරාජා මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, එම්. එල්. එන්. වික්‍රමසිංහ මහතා 1970 දෙසැම්බර් මස 6 දින ගාල්ලේ අතිරේක මහෙස්ත්‍රාත් තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන, අතිරේක නාගරික මහෙස්ත්‍රාත් තැන, ළමා මහෙස්ත්‍රාත් තැන සහ අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන වශයෙන්.

අංකය : ජේඑල්/ජී. 14/65.

එල්. ඒ. ගුණවර්ධන මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, එල්. ඩබ්ලිව්. ප්‍රනාන්දු මහතා 1970 දෙසැම්බර් මස 3 දින සිට 6 දින දක්වා සහ 10 සහ 11 දිනයන්හි ගම්පොල ක්‍රියා කරන මහනුවර අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන, ගම්පොල අතිරේක මහෙස්ත්‍රාත් තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන සහ ළමා මහෙස්ත්‍රාත් තැන වශයෙන්.

අංකය : ජේඑල්/ජී. 13/64.

එස්. බී. ගුණවර්ධන මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, ජේ. එස්. රාජපක්ෂ මහතා 1970 නොවැම්බර් මස 27 දින හලාවත සහ පුත්තලමේ අතිරේක මහෙස්ත්‍රාත් තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන, අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන සහ ළමා මහෙස්ත්‍රාත් තැන වශයෙන්.

අංකය : ජේඑල්/ඩබ්ලිව්. 13/67.

ඩබ්ලිව්. එන්. එස්. විජේරත්න මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, එම්. ඕ. එම්. තහිර් මහතා 1970 නොවැම්බර් මස 29 සහ 30 දිනවල කුරුණෑගල අතිරේක මහෙස්ත්‍රාත් තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන, අතිරේක නාගරික මහෙස්ත්‍රාත් තැන, ළමා මහෙස්ත්‍රාත් තැන සහ අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන වශයෙන්.

අංකය : ජේඑල්/එච්. 2/57.

එම්. ඒ. එම්. හුසේන් මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, ජේ. එස්. රාජපක්ෂ මහතා 1970 නොවැම්බර් මස 27 දින සිට 1970 දෙසැම්බර් මස 3 දින දක්වා හලාවත සහ පුත්තලමේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන සහ අතිරේක මහෙස්ත්‍රාත් තැන වශයෙන්.

අංකය : ජේඑල්/පී. 6/65.

ආර්. පරමකුරු මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, කේ. ඊ. කදිර්ගාමලිංගම් මහතා 1970 දෙසැම්බර් මස 2 වන දින යාපනයේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන, අතිරේක මහෙස්ත්‍රාත් තැන සහ අතිරේක නාගරික මහෙස්ත්‍රාත් තැන වශයෙන්.

අංකය : ජේඑල්/ඩී. 27/64.

එම්. බී. ජී. දිසානායක මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, පී. වී. සේනාතිරාජා මහතා 1970 දෙසැම්බර් 1 දින සිට 5 දින දක්වා මන්නාරම් සහ වවුනියාවේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන, අතිරේක ළමා මහෙස්ත්‍රාත් තැන සහ අතිරේක මහෙස්ත්‍රාත් තැන වශයෙන්.

අංකය : ජේඑල්/ඒ. 14/68.

සී. අමරසිංහ මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, මහින්ද විජේසිරිය මහතා 1970 නොවැම්බර් මස 26 දින හෝමාගම පිහිටි උසාවියේ ක්‍රියා කරන කොළඹ අතිරේක මහෙස්ත්‍රාත් තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන, ළමා මහෙස්ත්‍රාත් තැන සහ අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන වශයෙන්.

අංකය : පීඑල්/එස්. 7/49.

කේ. සින්නතම්බි මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, ආර්. වී. විල්වරාජා මහතා 1970 නොවැම්බර් මස 26 දින සිට 30 දින දක්වා වවුනියාවේ අතිරේක මහෙස්ත්‍රාත් තැන, ළමා මහෙස්ත්‍රාත් තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන සහ අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන වශයෙන්.

අංකය : පීඑල්/ආර්. 6/60.

පී. එස්. රාමචන්ද්‍ර මහත්මිය නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, එච්. එම්. ගුණසේකර මහතා 1970 නොවැම්බර් මස 9 වැනි දින සහ 10 වැනි දිනයන්හි තංගල්ල දිස්ත්‍රික්කයේ මාගම් පත්තුව, නැගෙනහිර ගිරුවාපත්තුව, උතුරු ගිරුවාපත්තුව සහ දකුණු ගිරුවාපත්තුව ප්‍රාදේශීය ආදායම් නිලධාරී කොට්ඨාශයන්හි ගම්බද උසාවි සභාපති වශයෙන් වැඩ බැලීමට.

අංකය : පීඑල්/ආර්. 6/67.

එස්. රාජනාදන් මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, එම්. එච්. කාරයප්පර් මහතා 1970 නොවැම්බර් මස 7, 8, 9, 10, 11 සහ 12 වැනි දිනයන්හි කල්මුනේ දිස්ත්‍රික්කයේ පානම සහ අක්කරෙයිපත්තු ගම්බද උසාවි සභාපති වශයෙන් වැඩ බැලීමට.

අංකය : පීඑල්/ඒ. 10/61.

එච්. අමීන් මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, කේ. ඒ. අරසකෝන් මහතා 1970 නොවැම්බර් මස 30, දෙසැම්බර් මස 2, 3 සහ 4 වැනි දිනයන්හි මඩකලපුව දිස්ත්‍රික්කයේ එරවූර් කෝරළේ බින්තැන්න පත්තු සහ උතුරු මාම්මුනෙයි පත්තුව ගම්බද උසාවි සභාපති වශයෙන් වැඩ බැලීමට.

අංකය : පීඑල්/එෆ්ජ්. 3/64.

ඩබ්ලිව්. ඒ. බී. ඕ. ප්‍රනාන්දු මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, ටී. යූ. කරවිට මහතා 1970 නොවැම්බර් මස 9 වැනි දින සිට 10 වැනි දින දක්වා, අනුරාධපුර දිස්ත්‍රික්කයේ උතුරු හුරුළු පළාත සහ දකුණු හුරුළු පළාත, මැද හුරුළු පළාත ප්‍රාදේශීය ආදායම් නිලධාරී කොට්ඨාශයන්හි අතිරේක ගම්බද උසාවි සභාපති වශයෙන් වැඩ බැලීමට.

අංකය : පීඑල්/එස්. 7/49.

කේ. සින්නතම්බි මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, ආර්. වී. විල්වරාජා මහතා 1970 නොවැම්බර් මස 26, 27, 29 සහ 30 දිනයන්හි වවුනියා සහ මන්නාරම් දිස්ත්‍රික්කයන්හි වවුනියා දකුණු ගම්බද උසාවි සභාපති සහ මාන්තෙයි අතිරේක ගම්බද උසාවි සභාපති වශයෙන් වැඩ බැලීමට.

අංකය : පීඑල්/ජී. 2/50.

ඩබ්ලිව්. ගුණවර්ධන මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, අයි. එම්. වීරරත්න මෙනවිය 1970 නොවැම්බර් මස 26 වැනි දින රත්නපුර දිස්ත්‍රික්කයේ කඩවත මැද සහ නවදුන් කෝරළේ ගම්බද උසාවි සභාපති වශයෙන් වැඩ බැලීමට.

අංකය : පීඑල්/එස්. 17/68.

ඒ. එම්. අයි. සහීඩ් මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, ආර්. වී. විල්වරාජා මහතා 1970 නොවැම්බර් මස 15 වැනි දින වවුනියාවේ සහ යාපනය දිස්ත්‍රික්කයන්හි වවුනියාවේ උතුරු සහ මුහුදුබඩ පත්තු ගම්බද උසාවි සභාපති සහ පුනාකාරි තුන්කුකායි අතිරේක ගම්බද උසාවි සභාපති වශයෙන් වැඩ බැලීමට.

අංකය : පීඑල්/පී. 10/63.

ඩී. ඊ. එස්. රණසිංහ මහතා 1970 දෙසැම්බර් මස 2, 3, 4, 6, 7, 8, 9, 10, 11, 14, 15, 16, 17, 18, 19 සහ 21 වැනි දිනයන් හි හෝ නැවත නියමයක් කරන තුරු හෝ හලාවත දිස්ත්‍රික්කයේ උතුරු සහ දකුණු පිටිගල් කෝරළයන් හි ගම්බද උසාවි සභාපති වශයෙන් වැඩ බැලීමට.

අංකය : පීඑල්/ටී. 3/53.

එච්. එස්. තිලකරත්න මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, කේ. එම්. අතුකෝරළ මහත්මිය 1970 දෙසැම්බර් මස 2 වැනි දින කළුතර දිස්ත්‍රික්කයේ බටහිර පස්යොදුන් කෝරළේ මහ පත්තුව, ගඟබොඩ පත්තුව සහ කළුතර තොට මුනේ ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයන් හි ගම්බද උසාවි සභාපති වශයෙන් වැඩ බැලීමට.

අංකය : පීඑල්/කේ. 8/64.

එස්. කඩවත ආරච්චි මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, ජී. සූරියආරච්චි මහතා 1970 නොවැම්බර් මස 19, 20, 22, 23, 24, 25 සහ 27 වැනි දිනයන් හි කුරුණෑගල දිස්ත්‍රික්කයේ කුලියාපිටිය, පන්නල, බිංගිරිය සහ දේවමැදි හත්පත්තුවේ ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයන් හි ගම්බද උසාවි සභාපති වශයෙන් වැඩ බැලීමට.

අංකය : පීඑල්/එස්. 16/62.

කේ. සන්මුගනාදන් මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, කේ. කනපතිපිල්ලේ මහතා 1970 ඔක්තෝබර් මස 30, 31, නොවැම්බර් මස 1 සහ 2 දිනයන් හි පේදුරුතුඩුව දිස්ත්‍රික්කයේ තෙන්මරච්චි, පච්චිලයිප්පලෙයි, කරච්චි සහ පුනාකාරි තුන්නුකායි ගම්බද උසාවි සභාපති වශයෙන් වැඩ බැලීමට.

අංකය : සීජේසාප්‍ර/ඒ. 10/70.

අල්හජ් එම්. සී. එම්. හසන් මහතා 1970 දෙසැම්බර් මස 1 දින සිට තුන්අවුරුදු කාලසීමාවට යටත්ව මහනුවර දිස්ත්‍රික්කයේ යටිනුවර ආදායම් කොට්ඨාශය තුළ කාතිවරයෙකු වශයෙන්.

එල්. සමරතුංග,
අධිකරණ සේවා කොමිෂන් සභාවේ
වැඩ බලන ලේකම්.

1970 දෙසැම්බර් මස 3 දා,
කොළඹ 12,
අධිකරණ සේවා කොමිෂන් සභා කාර්යාලයේදී.

12-416

---

## ආණ්ඩුවේ නිවේදන

ඇල්.ඩී.බී 80/51

### ප්‍රසිද්ධ රඟ දැක්වීම් ආඥපනත

(176 වැනි අධිකාරය වන) ප්‍රසිද්ධ රඟ දැක්වීම් ආඥපනතේ 6 වැනි වගන්තිය යටතේ සංස්කෘතික කටයුතු පිළිබඳ ඇමතිවරයා විසින් පනවනු ලැබූ ආඥාව.

ඇස්. ඇස්. කුලතිලක,
සංස්කෘතික කටයුතු පිළිබඳ ඇමති.

1970 නොවැම්බර් මස 22 වැනි දින,
කොළඹ දීය.

**ආඥාව**

1953 ජනවාරි මස 2 වැනි දින හා අංක 10,485 දරන ගැසට් පත්‍රයෙහි ප්‍රසිද්ධ කරන ලදුව, පසුව සංශෝධිත, 1952 ප්‍රසිද්ධ රඟ දැක්වීම් ආඥාව, එහි වූ හතර වැනි උපලේඛනය වෙනුවට පහත සඳහන් අළුත් උපලේඛනය ආදේශ කිරීමෙන් එය තවදුරටත් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

"හතර වෙනි උපලේඛනය"

1. සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ ස්ථිර ලේකම් (සභාපති).
2. පොලිස්පති.
3. කොළඹ නාගරික කොමසාරිස්.
4 අධ්‍යාපන අධ්‍යක්ෂ ජනරාල්.
5. පරිවාස හා ළමාරක්ෂක සේවා කොමසාරිස්.
6. සංස්කෘතික කටයුතු පිළිබඳ අධ්‍යක්ෂ.
7. ලංකා ගුවන්විදුලි සංස්ථාවේ අධ්‍යක්ෂ ජනරාල්.
8. ප්‍රවෘත්ති අධ්‍යක්ෂ.
9. සී. වී. ප්‍රනාන්දු මහත්මිය.
10. එම්. මුතුතම්බි මහත්මිය.
11 එස්. ඒ. වික්‍රමසිංහ මහත්මිය.
12. ඒ. කාතිගේසන් මහත්මිය.
13. එස්. ඒ. දිසානායක මහත්මිය.
14. ඒ. නිමලසූරිය මහත්මිය.
15. සී. අයි. රත්වත්තේ මහත්මිය.
16. ගංගා මුණසිංහ මහත්මිය.
17. පී. එම්. රත්නවේල් මහත්මිය.
18. ටී. බී. සුබසිංහ මහත්මිය.
19. බාලම් ලක්ෂ්මනන් මහත්මිය.
20. සෝමසිරි ගලගෙදර මහතා.
21 පියල් වික්‍රමසිංහ මහතා.
22. ඩබ්ලිව්. කේ. සමරදාස මහතා.
23. ආරියවංශ පතිරාජ මහතා.
24. ඊ. වික්ටර් දාබරේ මහතා.
25. ආර්. ඒ. සිරිල් පෙරේරා මහතා.
26. එස්. එස්. විජේරත්න මහතා.
27. ඩී. ටී. ලියනමානගේ මහතා.
28. නලින් අබේනායක මහතා.
29 ඩබ්ලිව්. පී. ගුණතිලක මහතා.
30. ඩබ්ලිව්. බී. දොරකුඹුර මහතා.
31. ජී. එස්. අබේවර්ධන මහතා.
32. මර්වින් සී. පෙරේරා මහතා.
33. එස්. ඒ. මවුලානා මහතා.
34 එම්. බන්දුජීව පෙරේරා මහතා.
35 ජැක්සන් සේනාරත්න මහතා.
36. නිමල් හොරණ මහතා.
37. ඩී. ජී. ඕ. වජිරපාණී මහතා.
38. එච්. කේ. මහින්දදාස මහතා.
39. සරත් කුරේ මහතා.
40. ටී. දුරෙයිසිංහම් මහතා.
41. ජී. ඒ. ආනන්ද ඊශ්වරම් මහතා.
42 ආචාර්ය කේ. සිවතම්බි මහතා.
43. ශ්‍රී සිවප්‍රගාසම් මහතා.
44. ගුණසේන විතාන මහතා.
45. ඒ. එච්. රාජ්කොත්වලා මහතා.

2 මේ ආඥාවෙහි 1 වැනි ඡේදයෙන් සංශෝධනය කරනු ලැබූ පරිදි, 1952 ප්‍රසිද්ධ රඟ දැක්වීම් ආඥාවෙහි හතර වෙනි උපලේඛනයෙහි සඳහන් තැනැත්තන්ගේ සාමාජිකත්වය 1973 ජූනි මස 30 වෙනි දින අවසන් විය යුතුය.

12-42

---

## දැන්වීමයි

මෙහි පහත උපුටා දක්වන 1971 වර්ෂය සඳහා වූ ප්‍රසිඛ හා බැංකු නිවාඩු දින ලැයිස්තුව රාජ්‍ය පරිපාලන, පළාත් පාලන සා ස්වදේශ කටයුතු භාර ගරු ඇමතිතුමා විසින් අනුමත කර ඇති බව මහජනයාගේ දැනගැනීම සඳහා මෙයින් නිවේදනය කරමි.

ලයනල් ප්‍රනාන්දු,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ
අමාත්‍යාංශයේ ස්ථිර ලේකම් වෙනුවට.

1970 දෙසැම්බර් 3 වෙනි දා,
කොළඹ 7, වොරිංටන් චතුරශ්‍රයේදීය.

**1971—ප්‍රසිඛ හා බැංකු නිවාඩු දින**

ජනවාරි 1 වෙනිදා—ජාතික වීර දිනය * †

ජනවාරි 14 වෙනිදා—තෛයි පොන්ගල් දිනය * †

පෙබරවාරි 4 වෙනිදා—නිදහස් සමරු දිනය * †

පෙබරවාරි 7 වෙනිදා—ඊ-දුල්-අල්හා (හාජ් උත්සවය) * †

පෙබරවාරි 23 වෙනිදා—මහ සිව රාත්‍රි දිනය * †

අප්‍රේල් 9 වෙනිදා—මහ සිකුරාදා දිනය * †

අප්‍රේල් 11 වෙනිදා—පාස්කු ඉරිදා * †

අප්‍රේල් 13 වෙනිදා—සිංහල සහ දෙමළ අළුත් අවුරුදු පෙර දිනය * †

අප්‍රේල් 14 වෙනිදා—සිංහල සහ දෙමළ අළුත් අවුරුදු දිනය * †

අප්‍රේල් 25 වෙනිදා—විශේෂ බැංකු නිවාඩු දිනය †

මැයි 1 වෙනිදා—මැයි දිනය * †

මැයි 8 වෙනිදා—මිලා-දුන්-නබි (නබිනායකතුමාණන් වහන්සේ උපන් දිනය) * †

මැයි 10 වෙනිදා—වෙසක් පසළොස්වක් දිනට පසු දිනය * †

මැයි 16 වෙනිදා—විශේෂ බැංකු නිවාඩු දිනය †

ජූනි 30 වෙනිදා—විශේෂ බැංකු නිවාඩු දිනය †

ජූලි 1 වෙනිදා—විශේෂ බැංකු නිවාඩු දිනය †

සැප්තැම්බර් 19 වෙනිදා—විශේෂ බැංකු නිවාඩු දිනය †

සැප්තැම්බර් 26 වෙනිදා—බණ්ඩාරනායක සමරු දිනය * †

සැප්තැතම්බර් 27 වෙනිදා—විශේෂ බැංකු නිවාඩු දිනය †

ඔක්තෝබර් 10 වෙනිදා—විශේෂ බැංකු නිවාඩු දිනය †

ඔක්තෝබර් 18 වෙනිදා—දීපවාලි උත්සවය * †

නොවැම්බර් 20 වෙනිදා—ඊ-දුල්-ෆිතර් (රාමසාන් උත්සවය) * †

දෙසැම්බර් 25 වෙනිදා—නත්තල් උත්සවය * †

දෙසැම්බර් 31 වෙනිදා—විශේෂ බැංකු නිවාඩු දිනය †

* ප්‍රසිද්ධ නිවාඩු. † බැංකු නිවාඩු.

12-381

---

## (219 වෙනි අධිකාරය වන) සෞඛ්‍ය සේවා පනත

### ගාල්ල ආරෝග්‍යශාලා කාරක සභාව

(219 වෙනි අධිකාරය වන) සෞඛ්‍ය සේවා පනතෙහි II වෙනි වගන්තිය යටතේ 1970 දෙසැම්බර් මස 31 වෙනි දායින් අවසන් වන කාල සීමාවට ආනන්ද සූරියාරච්චි මහතා ගාල්ලේ ආරෝග්‍යශාලා කාරක සභාවේ සාමාජිකයෙක් වශයෙන් ගරු සෞඛ්‍ය ඇමතිතුමා විසින් පත් කරනු ලැබුහ.

සී. ඊ. එස්. වීරතුංග,
ස්ථිර ලේකම්.

1970 නොවැම්බර් මස 29 වෙනි දින,
කොළඹ සෞඛ්‍ය අමාත්‍යාංශයේදීය.

12-307

---

## (219 වෙනි අධිකාරය වන) සෞඛ්‍ය සේවා පනත

### උතුරු කොළඹ ආරෝග්‍යශාලා කාරක සභාව

(219 වෙනි අධිකාරය වන) සෞඛ්‍ය සේවා පනතෙහි II වන වගන්තිය යටතේ 1970 දෙසැම්බර් මස 31 දායින් අවසන් වන කාලසීමාවට, යූ. සී. එච්සේබියස් මහතා උතුරු කොළඹ ආරෝග්‍යශාලා කාරක සභාවේ සාමාජිකයෙක් වශයෙන් ගරු සෞඛ්‍ය ඇමතිතුමා විසින් පත්කරනු ලැබුහ.

සී. ඊ. එස්. වීරතුංග,
ස්ථිර ලේකම්.

1970 නොවැම්බර් මස 29 වන දින,
කොළඹ සෞඛ්‍ය අමාත්‍යාංශයේදීය.
12-386

---

ඇල්. සී.—සී. 54/58.

## 1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල් පනත

### පනතේ 10 (3) වැනි වගන්තිය යටතේ නියෝගය (13 වැනි නියෝගය)

1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල් පනතේ 10 වැනි වගන්තියේ (3) වැනි උප වගන්තියෙන් මාවෙත පැවරී ඇති බලතල ප්‍රකාර කම්කරු ඇමති මයිකල් පෝල් ද සොයිසා සිරිවර්ධන වන මම මෙහි වූ උපලේඛනයේ දක්වා ඇති රක්ෂිත වෘත්තිය සම්බන්ධයෙන්, එම උප වගන්තියේ කාර්යයන් සඳහා, 1970 දෙසැම්බර් මස 31 වැනි දිනය, නියම කරමි.

ඇම්. පී. ද ඉසඩ්. සිරිවර්ධන,
කම්කරු ඇමති.

1970 නොවැම්බර් මස 29 දින,
කොළඹදීය.

### උපලේඛනය

1. ඉඩමේ ප්‍රමාණය කුමක් වුවද, තනි පුද්ගලයකු හෝ තනි පුද්ගලයකුට වැඩි සංඛ්‍යාවක් හෝ සේවයේ යොදවා ඇති පහත සඳහන් වගා, එනම් තේ, රබර්, පොල්, කොකෝ, කරදමුංගු, කෝපි, ගම්මිරිස්, දුම්කොළ, වී, එළවලු, පලතුරු, ධාන්‍ය හෝ වෙනත් යම් කෘෂි ද්‍රව්‍ය යන වගාවලින් එකක් හෝ වැඩි ගණනක් වගා කර ඇති යම් ඉඩමක රක්ෂාව.

2. පුද්ගලයන් පස් දෙනෙකුට අඩු ප්‍රමාණයක් සේවයේ යොදවා ඇති, සිවිල් ඉංජිනේරු හෝ යාන්ත්‍රික ඉංජිනේරු හෝ විදුලිය ඉංජිනේරුමය ව්‍යාපාරයක් සම්පූර්ණ වශයෙන් හෝ කොටස් වශයෙන් කරගෙන යාම පිණිස පිහිටුවා ඇත්තාවූ යම්කිසි ආයතනයක රක්ෂාව.

3. පුද්ගලයන් පස් දෙනෙකුට අඩු ප්‍රමාණයක් සේවයේ යොදවා ඇති, පොල් නිෂ්පාදනයන් සෑදීමේ ව්‍යාපාරයේ එනම්, කපාපු පොල්, කොප්පරා, පොල්තෙල් හෝ කොහු කෙඳි සහ වෙනත් භාණ්ඩ සම්පූර්ණ වශයෙන් හෝ කොටස් වශයෙන් සෑදීමෙහිලා පිහිටුවා ඇති යම්කිසි ආයතනයක රක්ෂාව.

4. පුද්ගලයන් පස් දෙනෙකුට අඩු ප්‍රමාණයක් සේවයේ යොදවා ඇති, සම්පූර්ණ වශයෙන් හෝ කොටස් වශයෙන් කොහු කෙඳි, ගුදිරි කොහු සහ ඇට කෙඳි කොහු පිටරට යැවීමේ ව්‍යාපාරයේ, එනම් ගබඩාවලදී කොහු කෙඳි හෝ ඇට කෙඳි කොහු ලබාගැනීමේ, ගුදිරි කොහු හෝ ඇට කෙඳි කොහු අපනයනය කිරීම සඳහා යෝග්‍ය තත්ත්වයට ගෙන ඒමෙහි හා ඇහිරීමෙහි සහ ගුදිරි කොහු හෝ ඇට කෙඳි කොහු නැව් ගත කිරීම සඳහා ප්‍රවාහණය කිරීමේ කටයුතු සඳහා පිහිටුවා ඇති යම්කිසි ආයතනයක රක්ෂාව.

5. පුද්ගලයන් පස් දෙනෙකුට අඩු ගණනක් සේවයේ යොදවා සිටින, සම්පූර්ණ වශයෙන් හෝ කොටස් වශයෙන් මුද්‍රණකරුවෙකුගේ ව්‍යාපාරයක් කරගෙන යාම සඳහා පිහිටුවා ඇති යම්කිසි ආයතනයක රක්ෂාව.

6. පුද්ගලයන් පස් දෙනෙකුට අඩු ගණනක් සේවයේ යොදවා සිටින සම්පූර්ණ වශයෙන් හෝ කොටස් වශයෙන්, ගාස්තුවක් ගැනීම සඳහා හෝ ත්‍යාගයක් ලබාගැනීම සඳහා පුද්ගලයන් හෝ භාණ්ඩ මහ මාර්ගවලින් රැගෙන යාමේ ව්‍යාපාරයක් සඳහා පිහිටුවා ඇති යම්කිසි ආයතනයක රක්ෂාව.

7. පුද්ගලයන් පස්දෙනෙකුට අඩු ගණනක් සේවයේ යොදවා සිටින, සම්පූර්ණ වශයෙන් හෝ කොටස් වශයෙන් ගොඩනැගිලි නඩත්තු කිරීම හා අළුත්වැඩියා කිරීම සහ ඒවාට වෙනස් කිරීම් කිරීමද ඇතුළුව ගොඩනැගිලි තැනීමේ ව්‍යාපාරය කරගෙන යාම සඳහා පිහිටුවා ඇති යම්කිසි ආයතනයක රක්ෂාව.

8. පුද්ගලයන් පස් දෙනෙකුට අඩු ගණනක් සේවයේ යොදවා සිටින, සම්පූර්ණ වශයෙන් හෝ කොටස් වශයෙන්, අරක්කු නිපදවීම හෝ විකිණීම හෝ විනාකිරි නිපදවීම හෝ විකිණීම හෝ තාල වර්ගයේ යම්කිසි ගස් වර්ගයකින් රා පෙරීම හෝ එම රා විකිණීම යන ව්‍යාපාරයක් සඳහා පිහිටුවා ඇති යම්කිසි ආයතනයක රක්ෂාව.

9. පුද්ගලයන් පස් දෙනෙකුට අඩු ගණනක් සේවයේ යොදවා සිටින සම්පූර්ණ වශයෙන් හෝ කොටස් වශයෙන් මිනිරන් ආකර කර්මාන්තය හෝ මිනිරන් පිටරට යැවීම සඳහා සකස් කිරීමේ කර්මාන්තයක් සඳහා පිහිටුවා ඇති යම්කිසි ආයතනයක රක්ෂාව.

10. පුද්ගලයන් පස් දෙනෙකුට අඩු ගණනක් සේවයේ යොදවා සිටින සම්පූර්ණ වශයෙන් හෝ කොටස් වශයෙන් දුම්කොල හෝ දුම්කොල භාණ්ඩ නිෂ්පාදන ව්‍යාපාරය සඳහා පිහිටුවා ඇති යම්කිසි ආයතනයක රක්ෂාව.

11. සම්පූර්ණ වශයෙන් හෝ කොටස් වශයෙන් බීඩි නිෂ්පාදන ව්‍යාපාරය සඳහා පිහිටුවා ඇති යම්කිසි ආයතනයක තිබෙන රක්ෂාව.

මේ ඡේදයේ "රක්ෂාව" යන්නට, ආයතනයේ අයිතිකරුගෙන් හෝ ඔහුගේ නියෝජිතයාගෙන් හෝ වෙනත් තැනැත්තාගෙන් අමු ද්‍රව්‍යය ලබාගෙන තම නිවසේ හෝ වෙන ස්ථානයක බීඩි නිෂ්පාදනය කොට අනතුරුව නිෂ්පාදිත බීඩි අයිතිකරුට හෝ ඔහුගේ නියෝජිතයාට හෝ එම වෙනත් තැනැත්තාට බාරදීම සඳහා යම් පුද්ගලයෙකු රක්ෂාවෙහි යෙදවීමද ඇතුළත් වන්නේ ය.

12. පුද්ගලයන් පස් දෙනෙකුට අඩු සංඛ්‍යාවක් සේවයේ යොදවා සිටින සම්පූර්ණ වශයෙන් හෝ අර්ධ වශයෙන් බේකරිකරුවෙකුගේ ව්‍යාපාරයක් කරගෙන යෑම සඳහා පිහිටුවා ඇති යම්කිසි ආයතනයක රක්ෂාව.

13. පුද්ගලයන් පස් දෙනෙකුට අඩු සංඛ්‍යාවක් සේවයේ යොදවා සිටින සම්පූර්ණ වශයෙන් හෝ කොටස් වශයෙන් කුරුඳු භාණ්ඩ නිෂ්පාදනය සඳහා පිහිටුවා ඇති යම්කිසි ආයතනයක රක්ෂාව.

14. පුද්ගලයන් පස් දෙනෙකුට අඩු සංඛ්‍යාවක් සේවයේ යොදවා සිටින, සම්පූර්ණ වශයෙන් හෝ කොටස් වශයෙන් ගඩොල් හෝ උළු නිෂ්පාදනය කිරීම හෝ විකිණීමේ ව්‍යාපාර සඳහා පිහිටුවා ඇති යම්කිසි ආයතනයක රක්ෂාව.

15. සිය පවුලේ උදවියම පමණක් සේවයේ යොදවා සිටින ආයතනයක් වශයෙන් යම්කිසි පුද්ගලයෙකු විසින් කරගෙන යන ආයතනයක් නොවන, පුද්ගලයන් තුන් දෙනෙකුට අඩු සංඛ්‍යාවක් සේවයේ යොදවා සිටින, සම්පූර්ණ වශයෙන් හෝ කොටස් වශයෙන් යම්කිසි තොග හෝ සිල්ලර වෙළඳාමක් සඳහා පිහිටුවා ඇති යම්කිසි ආයතනයක රක්ෂාව.

16. පුද්ගලයන් තුන් දෙනෙකුට අඩු සංඛ්‍යාවක් සේවයේ යොදවා සිටින (107 වන අධිකාරය වන) සමුපකාර සමිති ආඥාපනත යටතේ ලියාපදිංචි කරනු ලැබූ යම්කිසි සමුපකාර සමිතියක රක්ෂාව.

17. සිය පවුලේ උදවියම පමක් රක්ෂාවේ යොදවන ආයතනයක් වශයෙන්, යම්කිසි පුද්ගලයෙකු විසින් කරගෙන යනු ලබන ආයතනයක් නොවන, පුද්ගලයන් තුන් දෙනෙකුට අඩු සංඛ්‍යාවක් සේවයේ යොදවන, සම්පූර්ණ වශයෙන් හෝ කොටස් වශයෙන්

පහත සඳහන් කාර්යයන්ගෙන් එකක් හෝ වැඩි ගණනක් කරගෙන යාමට එනම්, වහාම පරිභෝජනය කිරීම සඳහා ආහාර හෝ බීම සැපයීම හෝ අමුත්තන්ට හෝ නවාතැන්කරුවන්ට සිටීමට පහසුකම් සැපයීම සඳහා පිහිටුවා ඇති යම්කිසි ආයතනයක රක්ෂාව.

18. සිය පවුලේ අයට පමණක් රක්ෂාවේ යොදවන ආයතනයක් වශයෙන් යම්කිසි පුද්ගලයෙකු විසින් කරගෙන යනු ලබන ආයතන යක් නොවන, පුද්ගලයන් තුන් දෙනෙකුට අඩු සංඛ්‍යාවක් සේවයේ යොදවා සිටින, සම්පූර්ණ වශයෙන් හෝ කොටස් වශයෙන් හිසකෙස් කපන්නෙකුගේ හෝ සම්භාහකයෙකුගේ ව්‍යාපාරයක් කරගෙන යාම පිණිස හෝ රූ වැඩුම් හලක් පවත්වාගෙන යාම පිණිස පිහිටුවනු ලැබූ යම්කිසි ආයතනයක රක්ෂාව.

19. සිය පවුලේ උදවියම පමණක් සේවයේ යොදවා සිටින ආයතන යක් වශයෙන් යම්කිසි පුද්ගලයෙකු විසින් කරගෙන යනු ලබන ආයතනයක් නොවන, පුද්ගලයන් තුන් දෙනෙකුට අඩු සංඛ්‍යාවක් සේවයේ යොදවා සිටින, සම්පූර්ණ වශයෙන් හෝ කොටස් වශයෙන් වෛද්‍ය, ශල්‍ය, දන්තමය, අක්ෂිමය හෝ පශු හෝ වෙනත් සෞඛ්‍ය සේවාවන් සැපයීමේ ව්‍යාපාරයක් කරගෙන යාම උදෙසා පිහිටුවනු ලැබූ යම්කිසි ආයතනයක රක්ෂාව.

20. සිය පවුලේ උදවියම පමණක් සේවයේ යොදවා සිටින ආයතනයක් වශයෙන් යම්කිසි පුද්ගලයෙකු විසින් කරගෙන යනු ලබන ආයතනයක් නොවන, පුද්ගලයන් තුන් දෙනෙකුට අඩු සංඛ්‍යාවක් සේවයේ යොදවා තිබෙන සම්පූර්ණ වශයෙන් හෝ කොටස් වශයෙන් සායම් පොවන්නකුගේ, ලොන්ඩරිකරුවෙකුගේ හෝ වියළි ඇපුල්ලුම් කරුවෙකුගේ ව්‍යාපාරයක් කරගෙන යාම සඳහා පිහිටුවනු ලැබූ ආයතනයක රක්ෂාව.

21. සිය පවුලේ උදවියම පමණක් සේවයේ යොදවා සිටින ආයතන යක් වශයෙන් යම්කිසි පුද්ගලයෙකු විසින් කරගෙන යනු ලබන ආයතනයක් නොවන, පුද්ගලයන් තුන් දෙනෙකුට අඩු සංඛ්‍යාවක් සේවයේ යොදවා ඇති සම්පූර්ණ වශයෙන් හෝ කොටස් වශයෙන්, නීතිඥයෙකුගේ, උපදේශක ඉංජිනේරුවෙකුගේ, නිර්මාපකයෙකුගේ, පොත් තබන්නෙකුගේ, ඇන්වීම් පලකරන නියෝජිතයෙකුගේ, වෙන්දේසිකරුවෙකුගේ විශ්ලේෂක රසඥයෙකුගේ හෝ චිත්‍ර ශිල්පියෙකුගේ යම්කිසි වෘත්තියක් කරගෙන යාම පිණිස පිහිටුවනු ලැබූ යම්කිසි ආයතනයක රක්ෂාව.

22. සිය පවුලේ උදවියම පමණක් සේවයේ යොදවා සිටින ආයතනයක් වශයෙන් යම්කිසි පුද්ගලයෙකු විසින් කරගෙන යනු ලබන ආයතනයක් නොවන, පුද්ගලයන් තුන් දෙනෙකුට අඩු සංඛ්‍යාවක් සේවයේ යොදවා තිබෙන, සම්පූර්ණ වශයෙන් හෝ කොටස් වශයෙන් කිරිපට්ටිකරුවෙකුගේ ව්‍යාපාරයක් කරගෙන යාම සඳහා පිහිටුවනු ලැබූ යම්කිසි ආයතනයක රක්ෂාව.

23. සිය පවුලේ උදවියම පමණක් සේවයේ යොදවා සිටින ආයතන යක් වශයෙන් යම්කිසි පුද්ගලයෙකු විසින් කරගෙන යනු ලබන ආයතනයක් නොවන, පුද්ගලයන් තුන් දෙනෙකුට අඩු සංඛ්‍යාවක් සේවයේ යොදවා සිටින, සම්පූර්ණ වශයෙන් හෝ කොටස් වශයෙන්—

(අ) ජීවන සංඛ්‍යා නිලධාරියෙකුගේ ; හෝ

(ආ) මිලකරුවෙකුගේ ; හෝ

(ඇ) ආදායම් තක්සේරු කරුවෙකුගේ ; හෝ

(ඈ) තැරැව්කරුවෙකුගේ ; හෝ

(ඉ) කොමිස් ලබන ඒජන්ත වරයෙකුගේ ; හෝ

(ඊ) ණය දෙන ඒජන්ත කෙනෙකුගේ ; හෝ

(උ) සැලසුම්කරුවෙකුගේ ; හෝ

(ඌ) ප්‍රවාහණ බඩු යවන ඉල්ලන හෝ බඩු ඉවත් කරන ඒජන්ත වරයෙකුගේ ; හෝ

(එ) නිවාස සහ වතු ඒජන්තවරයෙකුගේ ; හෝ

(ඒ) නිවාස අලංකාර කරන්නෙකුගේ ; හෝ

(ඔ) නිවාස සඳහා ගෘහ භාණ්ඩ සපයන්නෙකුගේ ; හෝ

(ඕ) පාලක සමාගමක ; හෝ

(ක) ආයෝජන සමාගමක ; හෝ

(ග) 1938 අංක 51 දරන වෙළඳ සමාගම් ආඥාපනත යටතේ ලියාපදිංචි කරන ලද වෙළඳ සමාගමක ; හෝ

(ම) උකස් සමාගමක ; හෝ

(ත) ප්‍රවෘත්ති ඒජන්තවරයෙකුගේ ; හෝ

(ද) මිණුම්කරුවෙකුගේ ; හෝ

(න) ගමන් බිමන් නියෝජිතයෙකුගේ ; හෝ

(ප) ප්‍රතිරක්ෂකයෙකුගේ ; හෝ

(බ) තක්සේරුකරුවෙකුගේ ; හෝ

ව්‍යාපාරයක් කරගෙන යාම සඳහා පිහිටුවා ඇති යම්කිසි ආයතනයක රක්ෂාව.

24. සිය පවුලේ උදවිය පමණක් සේවයේ යොදවා සිටින ආයතන යක් වශයෙන් යම්කිසි පුද්ගලයෙකු විසින් කරගෙන යනු ලබන ආයතනයක් නොවන්නාවූ, පුද්ගලයන් තුන් දෙනෙකුට අඩුවෙන් සේවයේ යොදවා සිටින්නාවූ යම්කිසි අධ්‍යාපනික හෝ අධ්‍යයන ආයතනයක (1953 අංක 44 දරන පාසල් ගුරුවරුන්ගේ විශ්‍රාම වැටුප් පනතේ ප්‍රතිපාදන අදාල වන්නාවූ රක්ෂා සහ විවේක කාලීණ සේවකයන් වශයෙන් රක්ෂාව කිරීම් හැර) රක්ෂාව.

25. සිය පවුලේ උදවියම පමණක් සේවයේ යොදවා සිටින ආයතන යක් වශයෙන් යම්කිසි පුද්ගලයෙකු විසින් කරගෙන යනු ලබන ආයතනයක් නොවන්නාවූත්, ණය වාසි කිරීමට, සකස් කිරීමට සහ බිල්පත් රැස් කිරීමට, පිටපත් කරදීමට, නිශ්චිත සැලසුම් සකස් කිරීමට, ඡායාරූප පිටපත් ගැනීමට, ලිපි යොමු ලිවීමට, තැපැල් කිරීමට සහ ලඝුලේඛන සේවාවන් කිරීමට සම්පූර්ණ වශයෙන් හෝ කොටස් වශයෙන් පිහිටුවා ඇත්තාවූත් පුද්ගලයන් තුන් දෙනෙකුට අඩු සංඛ්‍යාවක් සේවයේ යොදවා ඇත්තාවූත් යම්කිසි ආයතනයක රක්ෂාව.

26. සිය පවුලේ උදවියම පමණක් සේවයේ යොදවා සිටින ආයතන යක් වශයෙන් යම්කිසි පුද්ගලයෙකු විසින් කරගෙන යනු නොලබන්නාවූත්, සම්පූර්ණ වශයෙන් හෝ කොටස් වශයෙන් ඡායාරූප ශිල්පියෙකුගේ ව්‍යාපාරයක් කරගෙන යාම සඳහා පිහිටුවා ඇත්තාවූත්, පුද්ගලයන් තුන් දෙනෙකුට අඩු සංඛ්‍යාවක් සේවයේ යොදවා ඇත්තාවූත් යම්කිසි ආයතනයක රක්ෂාව.

27. පුද්ගලයන් තුන් දෙනෙකුට අඩු ගණනක් සේවයේ යොදවා සිටින, යම්කිසි කර්මාන්තයක ව්‍යාපාරයක හෝ වෙළඳ ව්‍යාපාර යක නියුතුව සිටින සාමාජිකයන්ගේ වැඩි දියුණුව සැලසීම සඳහා පිහිටුවා ඇත්තාවූ යම්කිසි සංගමයක රක්ෂාව.

28. පුද්ගලයන් තුන් දෙනෙකුට අඩු සංඛ්‍යාවක් සේවයේ යොදවා සිටින යම්කිසි සමාජ ශාලාවක රක්ෂාව.

29. සිය පවුලේ උදවියම පමණක් සේවයේ යොදවා සිටින ආයතන යක් වශයෙන් යම්කිසි පුද්ගලයෙකු විසින් කරගෙන යනු ලබන ආයතනයක් නොවන පුද්ගලයන් පස් දෙනෙකුට අඩු සංඛ්‍යාවක්, සේවයේ යොදවා සිටින, සම්පූර්ණ වශයෙන් හෝ අර්ධ වශයෙන් ගස් කැපීමේ හෝ ගලවා ඇම්මේ හෝ ඇව ප්‍රවාහණය කිරීමේ හෝ ඉරීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම සඳහා පිහිටුවනු ලැබූ යම්කිසි ආයතනයක රක්ෂාව.

30. සිය පවුලේ උදවියම පමණක් සේවයේ යොදවා සිටින ආයතන යක් වශයෙන් යම්කිසි පුද්ගලයෙකු විසින් කරගෙන යනු ලබන, ආයතනයක් නොවන පුද්ගලයන් පස් දෙනෙකුට අඩු ගණනක් සේවයේ යොදවා සිටින, සහමුලින්ම හෝ අඩක් වශයෙන් කළුගල් හැරීමේ ව්‍යාපාරයක් කරගෙන යාම සඳහා පිහිටුවා ඇත්තාවූ යම්කිසි ආයතනයක රක්ෂාව.

31. සිය පවුලේ උදවියම පමණක් සේවයේ යොදවා සිටින ආයතනයක් වශයෙන් යම්කිසි පුද්ගලයෙකු විසින් කරගෙන යනු ලබන, ආයතනයක් නොවන, පුද්ගලයන් පස් දෙනෙකුට අඩු ගණනක් සේවයේ යොදවා සිටින, භාණ්ඩ නිෂ්පාදනය කරන, වෙනස් කරන, පිරිසිදු කරන, අලුත්වැඩියා කරන, වැඩ දමන, ඔප කරන, විකිණීම සඳහා සිළියෙල කරන, කඩන හෝ විනාශ කරන හෝ භාණ්ඩ විපර්යාස කරන යම්කිසි ආයතනයක රක්ෂාව.

32. සිය පවුලේ උදවියම පමණක් සේවයේ යොදවා සිටින ආයතන යක් වශයෙන් යම්කිසි පුද්ගලයෙකු විසින් කරගෙන යනු ලබන ආයතනයක් නොවන, පුද්ගලයන් පස් දෙනෙකුට අඩු ගණනක් සේවයේ යොදවා සිටින, සම්පූර්ණ වශයෙන් හෝ අර්ධ වශයෙන් සතුන් මස් සඳහා මැරීම, එම මස් ආරක්ෂා කිරීම හා පිළියෙල කිරීම, එම මස් ප්‍රවාහණය කිරීම සඳහා පිහිටුවා ඇත්තාවූ යම්කිසි ආයතන යක රක්ෂාව.

33. පස් දෙනෙකුට අඩු සංඛ්‍යාවක් සේවයේ යොදවා සිටින, සම් පූර්ණ වශයෙන් හෝ අඩක් වශයෙන් ලංකාවේ ඕනෑම මුහුදු වරායක පහත සඳහන් කටයුතු වලින් එකක් එනම් :—

(අ) යම්කිසි නැවකින් හෝ යාත්‍රාවකින්, බඩු, ඇති කරන සත්ව යන්, තෙල් හෝ ගල් අඟුරු ගොඩබෑම හෝ රට පැටවීම ;

(ආ) යම්කිසි නැවකින් හෝ යාත්‍රාවකින් බඩු, ඇති කරන සත්ව යන්, තෙල් හෝ ගල් අඟුරු ගෙනයාම හෝ එයට එම දේවල් ගෙන ඒම ;

(ඇ) බඩු සහ වරාය උපකරණ ඔසවාගෙන යාම ;

(ඈ) බඩු, ඇති කරන සත්තු, තෙල් හෝ ගල් අඟුරු ගොඩබෑම, දොඹකරවලින් බෑම, ගෙනයාම, ඇසිරීම, ගබඩා කිරීම, බෙදීම, ඇදීම හෝ ඉවත් කිරීම ;

(ඉ) වරායේ වැඩ කටයුතු තිබෙන මගීන් සහ අනිකුත් අය ජලය මතුපිටින් රැගෙන යාම ;

(ඊ) ඇදගෙන යාම ;

(උ) ඉන්ධන. වතුර, නැව්, ගබඩා බඩු, ඉංජිනේරු බඩු හෝ අනිකුත් අවශ්‍යතාවයන් යාත්‍රාවලට සැපයීම ;

(ඌ) ඕනෑම නැවක හෝ යාත්‍රාවක වැඩ කටයුතු තිබෙන පරිපාලක කාර්ය මණ්ඩලය සහ කම්කරුවන් දියෙන් රැගෙන යාම ; සහ

(එ) නැව්වල හෝ යාත්‍රාවල ආරක්ෂාව හෝ පහසුවට අදාල වන වැඩක් කිරීම හෝ නැව්වලට බඩු පැටවීම හෝ ඒවායින් බෑමට පහසුකම් සැලසෙන යම්කිසි වැඩක් හෝ දෙයක් කිරීම සඳහා පිහිටුවා ඇති යම්කිසි ආයතනයක රක්ෂාව.

34. සිය පවුලේ උදවියම පමණක් සේවයේ යොදවා සිටින ආයතනයක් වශයෙන් යම්කිසි පුද්ගලයෙකු විසින් කරගෙන යනු ලබන ආයතනයක් නොවන, පස් දෙනෙකුට අඩු සංඛ්‍යාවක් සේවයේ යොදවා සිටින, සම්පූර්ණ වශයෙන් හෝ අධි වශයෙන් බඩු හෝ මගීන් මුහුදෙන් හෝ රට තුල ජල මාර්ගවලින් ප්‍රවාහණය කිරීම සඳහා පිහිටුවා ඇති යම්කිසි ආයතනයක රක්ෂාව.

35. සිය පවුලේ උදවියම පමණක් සේවයේ යොදවා සිටින ආයතනයක් වශයෙන් යම්කිසි පුද්ගලයෙකු විසින් කරගෙන යනු ලබන ආයතනයක් නොවන පස් දෙනෙකුට අඩු සංඛ්‍යාවක් සේවයේ යොදවා සිටින, සම්පූර්ණ වශයෙන් හෝ අධි වශයෙන්, ගබඩා කිරීම හෝ ගුදම්වල තැබීම සඳහා හෝ බඩු පැටවීමේ හෝ ගොඩ බෑමේ පහසුකම් දීමට ගාස්තුවක් හෝ ප්‍රතිලාභයක් ලැබීම සඳහා පිහිටුවා ඇති යම්කිසි ආයතනයක රක්ෂාව.

36. සිය පවුලේ උදවියම පමණක් සේවයේ යොදවා සිටින ආයතනයක් වශයෙන් යම්කිසි පුද්ගලයෙකු විසින් කරගෙන යනු ලබන ආයතනයක් නොවන, පුද්ගලයන් පස් දෙනෙකුට අඩු ගණනක් සේවයේ යොදවා සිටින, නාවික ඉංජිනේරු වැඩ කටයුතු සඳහා පිහිටිටුවා ඇති යම්කිසි ආයතනයක රක්ෂාව.

37. සිය පවුලේ උදවියම පමණක් සේවයේ යොදවා සිටින ආයතනයක් වශයෙන් යම්කිසි පුද්ගලයෙකු විසින් කරගෙන යනු ලබන ආයතනයක් නොවන, පුද්ගලයන් පස් දෙනෙකුට අඩු ගණනක් සේවයේ යොදවා සිටින, සම්පූර්ණ වශයෙන් හෝ අධි වශයෙන් අවමංගල්‍ය කටයුතු පිළියෙල කරන්නෙකුගේ ව්‍යාපාරයක් කරගෙන යාම සඳහා පිහිටුවා ඇති යම්කිසි ආයතනයක රක්ෂාව.

38. සිය පවුලේ උදවියම පමණක් සේවයේ යොදවා සිටින ආයතනයක් වශයෙන් යම්කිසි පුද්ගලයෙකු විසින් කරගෙන යනු ලබන ආයතනයක් නොවන—

(අ) මේ උපලේඛනයේ 1 සිට 37 දක්වා ඡේදවල ඇතුළත් කොට ඇති ;

(ආ) මේ දක්වා පනතේ 10 (3) වැනි වගන්තිය යටතේ පනවා ඇති යම්කිසි නියෝගයක ඇතුළත් කොට ඇති ;

(ඇ) ගෘහ සේවයේ නියුතු ;

(ඈ) ආයතනයක් හෝ සංවිධානයක් වන්නාවූත්, යම්කිසි පුණ්‍ය ආයතනයක හෝ ආගමික පුද පූජා හෝ සමාජ සේවා කටයුතු සඳහාම පමණක් පවත්වාගෙන යන ආයතනයක ; සහ

(ඉ) බාලපරාධකරුවන්ට, අනාත් දරුවන්ට හෝ අනාථ, ගොළු, බිහිරි හෝ අඳ අයට කාර්මික පුහුණුවක් දීම සඳහාම කරගෙන යනු ලබන ආයතනය ;

තිබෙන රක්ෂාවක් හැර, පුද්ගලයන් පස් දෙනෙකුට අඩු ගණනක් සේවයේ යොදවා තිබෙන ඕනෑම රක්ෂිත වෘත්තියක රක්ෂාව.

මේ උපලේඛනයේ " පනත " යනුවෙන් අදහස් වන්නේ, 1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල් පනත වන අතර ;

යම් ආයතනයක් සම්බන්ධයෙන් " පවුල " යනුවෙන් අදහස් කරන්නේ ආයතනයක්, කරගෙන යන පුද්ගලයා, එම පුද්ගලයාගේ කලත්‍රයා, එම පුද්ගලයාගේ යම් දරුවන් සහ එම කලත්‍රයාගේ යම් දරුවන් යන අයයි.

12-282

---

## මිල පාලන පනත

(2 වැනි අධිකාරය වන) අර්ථ නිරූපන ආඥාපනතේ 12 වැනි වගන්තිය සමග එක්ව කියවන ලද (173 වැනි අධිකාරය වන) මිල පාලන පනතේ 2 වැනි වගන්තිය යටතේ, විදේශීය හා දේශීය වෙළෙඳ ඇමතිතුමා විසින්, ජේ. සී. විජේවර්ධන මහතා (විවිධ ද්‍රව්‍ය) නියෝජ්‍ය මිල පාලක වශයෙන් දැරූ පත්වීම 1970 නොවැම්බර් මස 2 වෙනි දින සිට අවලංගු කර තිබේ.

ජ. බ. කැලේගම,
විදේශීය හා දේශීය වෙළෙඳ අමාත්‍යාංශයේ
ස්ථිර ලේකම්.

1970 නොවැම්බර් 27 දින,
කොළඹදී ය.

12-329

## සමගි මණ්ඩල පනත

### ආඥාව

1959 අංක 4 දරණ පනතින් සංශෝධිත 1946 ලංකා (ආණ්ඩු ක්‍රම) රාජසභා ආඥාවේ 47(2) වන වගන්තිය යටතේ පනවනු ලැබ 1970 ජූනි 16 වන දින අංක 14,910/8 දරණ අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ නිවේදනය සමග කියවිය යුතු 1963 අංක 12 දරණ පනතින් සංශෝධිත 1958 අංක 10 දරණ සමගි මණ්ඩල පනතේ 3(1), 3(8) හා 4(1) වන වගන්තිවලින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, අධිකරණ ඇමතිවරයාගේ පාර්ලිමේන්තු ලේකම් රත්නසිරි වික්‍රමනායක වන මම—

(අ) 1970 මැයි 8 වැනි දින අංක 14,905 දරණ ගැසට් පත්‍රයෙහි ප්‍රසිද්ධ කරනු ලැබූ 1958 අංක 10 දරණ සමගි මණ්ඩල පනතෙහි 3(2) වන වගන්තිය යටතෙහි වූ දැන්වීමේ උපලේඛනයෙහි අංක 31 දරණ ස්ථානයෙහි විස්තර කරනු ලැබූ මල්වත්ත ගම් ප්‍රදේශය සඳහා පිහිටුවනු ලැබූ සමගි දයකයින්ගේ සභාවේ සාමාජිකයන් වශයෙන් පහත සඳහන් තැනැත්තන් මෙයින් පත් කරමි :—

(1) මල්වත්ත, පුදූ මල්වත්ත පදිංචි කණපති පිල්ලෙයි සෙල්ලයියා මහතා.

(2) සම්මාන්තුරෙයි, සොරිකල්මුමෙයි පදිංචි ජුවාන් පිල්ලෙයි ඉක්නේෂියස් මහතා.

(3) සම්මාන්තුරෙයි, සොරිකල්මුනෙයි පදිංචි සවාරි අන්තෝනිමුත්තු මහතා.

(4) සම්මාන්තුරෙයි, සොරිකල්මුනෙයි පදිංචි රබායල් අන්තෝනි පිල්ලෙයි මහතා.

(5) සම්මාන්තුරෙයි, සොරිකල්මුනෙයි පදිංචි නිකිලාන් අන්තෝනි මහතා.

(6) සම්මාන්තුරෙයි, සොරිකල්මුනෙයි පදිංචි පිලිප් ජෝසෙප් මහතා.

(7) සම්මාන්තුරෙයි, සොරිකල්මුනෙයි පදිංචි ප්‍රන්සිස් අන්තෝනි මහතා.

(8) සම්මාන්තුරෙයි, සොරිකල්මුනෙයි පදිංචි කුරුසු අබුලින් මහතා.

(9) සම්මාන්තුරෙයි, සොරිකල්මුනෙයි පදිංචි අරුලප්පු ජුලියන් පයස් මහතා.

(10) සම්මාන්තුරෙයි, සොරිකල්මුනෙයි පදිංචි කේ. පේදුරු පෙරේරා මහතා.

(11) සම්මාන්තුරෙයි, සොරිකල්මුනෙයි පදිංචි අබ්දුල් හමීදු මොහමඩ් මකීන් මහතා.

(12) සම්මාන්තුරෙයි, විරචෝලයි පදිංචි බස්තියන් පිල්ලෙයි පීටර් සෙල්වම් මහතා.

(13) සම්මාන්තුරෙයි, විරචෝලයි පදිංචි ජුවන් පිල්ලෙයි සූවාති මහතා.

(14) සම්මාන්තුරෙයි, විරචෝලයි පදිංචි සිවනඩියාන් සින්න තුරෙයි මහතා.

(15) සම්මාන්තුරෙයි, විරචෝලයි පදිංචි නාගුරාන් අහමදු ලෙබ්බේ මහතා.

(16) මල්වත්ත පදිංචි සින්නතුරෙයි සෙල්ලතුරෙයි මහතා.

(17) මල්වත්ත, වීරමල්වත්තෙයි පදිංචි කන්දප්පන් සිවනඩියාන් මහතා.

(18) මල්වත්ත, තැපැල් කාර්යාලයේ වේලුපිල්ලෙයි නල්ලතම්බි මහතා.

(19) මල්වත්ත, කනපතිපුරම් පදිංචි කණපතිපිල්ලෙයි කතිර්කාම තම්බි මහතා.

(20) මල්වත්ත, කනපතිපුරම් පදිංචි තම්බිමුත්තු කන්තසියා මහතා.

(21) මල්වත්ත, මජීඩ්පුරම් පදිංචි මොහමදු ස්මැයිල් මොහමදු ඉබ්‍රාහිම් මහතා.

(22) මල්වත්ත, මජීඩ්පුරම් පදිංචි මොහමදුතම්බි මීරා ලෙබ්බේ මහතා.

(23) මල්වත්ත, මල්ලිකයිතීවු පදිංචි තම්බිනාදපිල්ලෙයි නාගරාජා මහතා.

(24) මල්වත්ත, වලතාපිට්ටි පදිංචි වෙල්ලයර් සුප්පයියා මහතා.

(25) මල්වත්ත, මල්ලිකයිතීවු පදිංචි සාමිතම්බි සින්නතම්බි මහතා.

(26) මල්වත්ත පදිංචි ජෙයසිංහ මුදියාන්සේලාගේ සුංචි බණ්ඩා මහතා.

(27) මල්වත්ත, මජීඩ්පුරම් පදිංචි මොහිදීන් බාස්සා මීරා ලෙබ්බෙ මහතා.

(ආ) මල්වත්ත, පුදුමල්වත්ත පදිංචි කණපතිපිල්ලෙයි සෙල්ලයියා මහතා ඉහත කී සභාවෙහි සභාපති වශයෙන් මෙයින් පත් කරමි.

(ඇ) ඉහත කී සභාවේ සාමාජිකයෙකු වශයෙන් ඒ එක් එක් තැනැත්තකු පත් කරනු ලබන කාලය මේ ආඥාව ගැසට් පත්‍රයෙහි ප්‍රසිද්ධ කරනු ලබන දිනයේ සිට අවුරුදු තුනක් විය යුතු බව ද මෙයින් නිශ්චය කරමි.

රත්නසිරි වික්‍රමනායක,
අධිකරණ ඇමතිවරයාගේ පාර්ලිමේන්තු ලේකම්.

1970 නොවැම්බර් මස 22 දින,
කොළඹ, අධිකරණ අමාත්‍යාංශයේ දීය.

12-297

## සමගි මණ්ඩල පනත

1959 අංක 4 දරණ පනතින් සංශෝධිත 1946 ලංකා (ආණ්ඩු ක්‍රම) රාජසභා ආඥාවේ 47(2) වන වගන්තිය යටතේ පනවනු ලැබ 1970 ජූනි 16 වන දින අංක 14,910/8 දරණ අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරුණු ලැබූ නිවේදනය සමග කියවිය යුතු 1963 අංක 12 දරණ පනතින් සංශෝධිත 1958 අංක 10 දරණ සමගි මණ්ඩල පනතේ 2 වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල පාවිච්චි කරමින්, අධිකරණ ඇමතිවරයාගේ පාර්ලිමේන්තු ලේකම්, රත්නසිරි වික්‍රමනායක වන මම, මීට යාකොට ඇති උපලේඛනයෙහි නිශ්චිතව සඳහන් ප්‍රදේශය තුළ එකී පනත ක්‍රියාත්මක විය යුතුයයි මෙයින් නිශ්චය කරමි.

රත්නසිරි වික්‍රමනායක,
අධිකරණ ඇමතිවරයාගේ පාර්ලිමේන්තු ලේකම්.

1970, නොවැම්බර් මස 29 වැනි දින,
කොළඹ අධිකරණ අමාත්‍යාංශයේදීය.

### උපලේඛනය

1. රත්නපුර දිස්ත්‍රික්කය තුළ පිහිටි පැල්මඩුල්ල සුළු නගර සභා ප්‍රදේශය.

2. කුරුණෑගල දිස්ත්‍රික්කය තුළ පිහිටි අලව්ව සුළු නගර සභා ප්‍රදේශය.

3. කුරුණෑගල දිස්ත්‍රික්කය තුළ පිහිටි නාරම්මල සුළු නගර සභා ප්‍රදේශය.

4. කොළඹ දිස්ත්‍රික්කය තුළ පිහිටි කටුනායක-සීදූව පළාත් ආණ්ඩු සභා ප්‍රදේශය.

12-319

## සමගි මණ්ඩල පනත

### 3 (2) වන වගන්තිය යටතේ වූ දැන්වීම

1959 අංක 4 දරණ පනතින් සංශෝධිත 1946 ලංකා (ආණ්ඩු ක්‍රම) රාජසභා ආඥාවේ 47(2) වන වගන්තිය යටතේ පනවනු ලැබ 1970 ජූනි 16 වන දින අංක 14,910/8 දරණ අති විශේෂ ගැසට් නිවේදනය සමග කියවිය යුතු 1963 අංක 12 දරණ පනතින් සංශෝධිත 1958 අංක 10 දරණ සමගි මණ්ඩල පනතේ 3 වන වගන්තියේ (2) වන උප වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල පාවිච්චි කරමින්, අධිකරණ ඇමතිවරයාගේ පාර්ලිමේන්තු ලේකම්, රත්නසිරි වික්‍රමනායක වන මම, මීට යාකොට ඇති උප ලේඛනයෙහි නිශ්චිතව සඳහන් එක් එක් ප්‍රදේශය සඳහා සමගිදායකයින්ගේ මණ්ඩලයන් සංස්ථාපනය කිරීමට අදහස් කරන බවත්, ඒ එක් එක් ප්‍රදේශයෙහි සමගිදායකයින්ගේ මණ්ඩලයට පත් කළ යුතු තැනැත්තන් සම්බන්ධයෙන් ඒ වගන්තියේ (3) වන උප වගන්තිය යටතේ නිර්දේශයන් ප්‍රාදේශීය ආදායම් පාලක නිලධාරි තැනගේ කායසීලයේ ඇති ආකෘති පත්‍රය මගින් 1971 ජනවාරි 15 වන දින හෝ ඊට පෙර මාවෙත ඉදිරිපත් කළ හැකි බවත් මෙයින් දැනුම් දෙමි.

රත්නසිරි වික්‍රමනායක,
අධිකරණ ඇමතිවරයාගේ පාර්ලිමේන්තු ලේකම්.

1970 නොවැම්බර් මස 29 දින,
කොළඹ, අධිකරණ අමාත්‍යාංශයේදීය.

### උපලේඛනය

(1) රත්නපුර දිස්ත්‍රික්කය තුළ පිහිටි පැල්මඩුල්ල සුළු නගර සභා ප්‍රදේශය.

(2) රත්නපුර දිස්ත්‍රික්කය තුළ පිහිටි අටකලන් කෝරලේ මැදපත්තු ගම් ප්‍රදේශය.

(3) රත්නපුර දිස්ත්‍රික්කය තුළ පිහිටි දෙහිගම්පල කෝරලේ එගොඩපොතපත්තු ගම් ප්‍රදේශය.

(4) අනුරාධපුර දිස්ත්‍රික්කය තුළ පිහිටි පදවිය ගම් ප්‍රදේශය.

(5) අනුරාධපුර දිස්ත්‍රික්කය තුළ පිහිටි කුංචුට්ටු කෝරලේ ගම් ප්‍රදේශය.

(6) අනුරාධපුර දිස්ත්‍රික්කය තුළ පිහිටි උතුරු කඩවත් කෝරළේ ගම් ප්‍රදේශය.

(7) අනුරාධපුර දිස්ත්‍රික්කය තුළ පිහිටි බටහිර කඩවත් කෝරළේ ගම් ප්‍රදේශය.

(8) අනුරාධපුර දිස්ත්‍රික්කය තුළ පිහිටි නැගෙනහිර කඩවත් කෝරළේ ගම් ප්‍රදේශය.

(9) අනුරාධපුර දිස්ත්‍රික්කය තුළ පිහිටි නැගෙනහිර කැඳෑ කෝරළේ ගම් ප්‍රදේශය.

(10) අනුරාධපුර දිස්ත්‍රික්කය තුළ පිහිටි බටහිර කැඳෑ කෝරළේ ගම් ප්‍රදේශය.

(11) අනුරාධපුර දිස්ත්‍රික්කය තුළ පිහිටි උතුරු නුවරගම් කෝරළේ ගම් ප්‍රදේශය.

(12) කුරුණෑගල දිස්ත්‍රික්කය තුළ පිහිටි නාරම්මල සුළු නගර සභා ප්‍රදේශය.

(13) කුරුණෑගල දිස්ත්‍රික්කය තුළ පිහිටි අලව්ව සුළු නගර සභා ප්‍රදේශය.

(14) කෑගල්ල දිස්ත්‍රික්කය තුළ පිහිටි මාවතපත්තු ගම් ප්‍රදේශය.

(15) කොළඹ දිස්ත්‍රික්කය තුළ පිහිටි ආඹිඅම්බලම ගම් ප්‍රදේශය.

(16) කොළඹ දිස්ත්‍රික්කය තුළ පිහිටි කටුනායක-සීදූව පළාත් ආණ්ඩු සභා ප්‍රදේශය.

12-317

## 1957 තේ 48 වෙනි අංකය දරණ මෝටර් ගමනාගමන පනත 25 (1) වෙනි වගන්තිය යටතේ කරන නියෝගය

ප්‍රවාහන අමාත්‍ය ධුරන්ධර ලෙස්ලි සයිමන් ගුණවර්ධන වන මම, මේ සමග ඇති උප ලේඛනයෙහි දක්වා ඇත්තාවූද, ලංකා ගමනා ගමන මණ්ඩලයේ කටයුතු සඳහා අත්කර ගැනීමට යෝජනාකර ඇත්තාවූද, නිශ්චල දේපොල අත්කර ගැනීම, 1957 තේ 48 වෙනි අංකය දරණ මෝටර් ගමනා ගමන පණතේ 25 වෙනි වගන්තියේ (1) වෙනි උප වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල පිට මෙයින් අනුමත කරමි.

ලෙස්ලි ගුණවර්ධන,
ප්‍රවාහන ඇමති.

1970.11.29 වෙනි දින,
කොළඹ දීය.

### උප ලේඛනය

දකුණු පලාතේ ගාලු දිස්ත්‍රික්කයේ තල්පෙ පත්තුව ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයේ ඉමදූව ග්‍රාමසේවක කොට්ඨාශයේ, කෝදගොඩ ගම්කායසී සහා සීමාවන් තුල ඉමදූව ගමේ පිහිටි ප්‍රමාණයෙන් අ.0 රූ.3 ප.0ක් පමණ වූ ඉඩම් කොටසක්.

උතුරට : ඉමදූවේ එස්. කොඩිකාරට අයිති යයි කියන ඉඩම සහ ප්‍රසිද්ධ වැඩ දෙපාර්තමේන්තුවට අයත් ගාල්ල–දෙනියාය පාරය ;

නැගෙනහිරට : ඉමදූව බටේමුල්ලේ කේ. පී. දියෝනිස් අප්පුහාමිට අයිතියයි කියන දේපොලය ;

දකුණට : ඉමදූව බටේමුල්ලේ වී. ඒ. ජිනදාස සහ අනිකුත් අයට අයිති යයි කියන දේපොල සහ හාල් මෝල ය ;

බස්නාහිරට : ඉමදූව–අහන්ගම මාර්ගය ;
යන මේ මායිම් තුල පිහිටියේ ය.

2. අත්කර ගැනීමට යෝජිත ඉඩම් කොටසේ විස්තර මෙසේය :—

ඉඩමේ නම : කොස්ගහ කුඹුර වත්ත. වරිපනම් අංක 23 අහන්ගම පාර.
ස්වභාවය : ගොඩනැගිල්ලක් සඳහා අත්තිවාරමක් දමා ඇති පොල් ඉඩමකි.

ප්‍රමාණය : දළ වශයෙන් අ 0 රූ. 3 ප. 0

අයිතිය ප්‍රකාශ කර්න්නාගේ නම සහ ලිපිනය : කේ. වී. කරෝලිස් අප්පුහාමි, බටේ මුල්ල, ඉමදූව සහ අනිකුත් අය.

12—408

## පඩිපාලක සභා ආඥාපනත

කුරුඳු කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාවේ සාමාජිකයකුව සිට මියගිය ජේ. ඊ. පී. රාජපක්ෂ මහතා වෙනුවට එම පඩිපාලක සභාවේ සේව්‍ය නියෝජිත සාමාජිකයෙකු ලෙස පෙනී සිටීමට පඩිපාලක සභා ආඥාපනතේ (136 වැනි අධිකාරය) 9 වන වගන්තිය යටතේ ගරු කම්කරු ඇමතිතුමන් විසින් සා.වි, කේ. එච්. ඩබ්ලිව්. ඕ. ද සිල්වා මහතා පත්කරන ලද බව එකී 1943 පඩිපාලක සභා ව්‍යවස්ථා සංග්‍රහයේ 26 වන ව්‍යවස්ථාව යටතේ මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඈ. ඵ. ගෝගලි මොරගොඩ,
කම්කරු අමාත්‍යාංශයේ සථිර ලේකම්වරයා.

1970 නොවැම්බර් මස 23 වැනි දින,
කොළඹ දීය.

12-326

---

## පඩි පාලක සභා ආඥාපනත

### නිවේදනයයි

රබර් වැවීමේ හා සැදීමේ කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාවේ සාමාජිකයින් ලෙස 1970 ඔක්තෝබර් මස 23 වැනි දින සිට අවුරුදු 3ක කාලයක් තුළ පෙනී සිටීමට පඩි පාලක සභා ආඥාපනතේ (136 වැනි පරිච්ඡේදය) 9 වැනි වගන්තිය යටතේ ගරු කම්කරු ඇමතිතුමන් විසින් පහත නම් සඳහන් තැනැත්තන් පත් කරන ලද බව 1943 පඩිපාලක සභා පිළිබඳ ව්‍යවස්ථා සංග්‍රහයේ 26 වැනි ව්‍යවස්ථාව යටතේ මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඈ. ඵ. ගෝගලි මොරගොඩ,
කම්කරු අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1970 නොවැම්බර් මස 25 වැනි දින,
කොළඹ දීය.

**නම නියම කොට පත් කරන ලද සාමාජිකවරු**

1. සමාදාන විනිශ්චයකාර එස්. ඩී. එල්. ජයවර්ධන මහතා
2. රෙජී රණතුංග මහතා
3. එච්. ඇම්. කිරිබණ්ඩා මහතා

**සේව්‍ය නියෝජිතවරු—**

1. ඩී. බී. ඇල්ලෙපොල මහතා
2. උපාලි ඩයස් මහතා
3. ඩී. ජේ. පෙරේරා මහතා
4. ස්ටැන්ලි විලියම් මහතා
5. එච් රාජකරුණා මහතා
6. ටී. ආර්. ආර්. විජේවික්‍රම මහතා.
7. සී. රාජසූරිය මහතා
8. ඇෆ්. ඩී. සී. විජේසිංහ මහතා
9. ජී. ඩී. පරණගම මහතා
10. ඩී. එස්. ආර්. ගුණවර්ධන මහතා
11. ඩබ්ලිව්. ටී. පී. ගුණතිලක මහතා
12. එච්. ජී. ආර්. ද මැල් මහතා
13. ඊ. අබේසුන්දර මහතා
14. කේ. ඇන්. සමරසිංහ මහතා
15. ටී. ඩී. ඒ. ද සිල්වා මහතා
16. ආර්. ඇම්. රත්නායක මහතා
17. ඇම්. ඇස්. ප්‍රනාන්දු මහතා
18. ඩී. ටී. වරාගොඩ මහතා

**සේවක නියෝජිතවරු—**

1. කේ. ජී. සුගතදාස මහතා
2. ඇස්. සිවසාමි මහතා
3. ඊ. ඒ. හේරත් බණ්ඩාර මහතා
4. ජේ. රත්නායක මහතා
5. වී. අන්නමලේ මහතා
6. ඒ. ඇම්. ඩී. රාජන් මහතා
7. ඒ. ලොඩ්වික් මහතා
8. පී. කුමාරස්වාමි මහතා
9. වී. මුනියන්ඩි මහතා
10. ඊ. ඒ. ජේ. අමරසේකර මහතා
11. ඒ. ඩී. සරත්චන්ද්‍ර මහතා
12. ඇස්. සෙල්ලයියා මහතා
13. වෝල්ටර් ජෝතිපාල මහතා
14. එස්. මහේන්ද්‍රන් මහතා
15. හිග්ගොඩ ධම්සේන මහතා
16. පා. ම. ඒ. අසීස් මහතා
17. වී. පී. සතාසිවම් මහතා
18. වී. රාජගෝපාල් මහතා

12-281

අංකය : ඩී/අයි 19.

## ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය, (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරවුල් පනත

### 4 (1) වන වගන්තිය යටතේ නියෝගයයි

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස්වරයාගේ ප්‍රකාශනයේ නියමිත කර දක්වා ඇති කාරණය පිළිබඳව, එක්සත් ඉංජිනේරු කම්කරු සමිතිය, 123, යූනියන් පෙදෙස, කොළඹ 2, ස වෝකර් සන්ස් ඇන්ඩ් කොම්පැණි ලිමිටඩ්, තැ. පෙ. 166, කොළඹ අතර කාර්මික ආරවුලක් පවතින හෙයින්ද,

කම්කරු ඇමති තැන්පත් මයිකල් පෝල් ද සොයිසා සිරිවර්ධන වන මම, 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1966 අංක 39 (1968 අංක 37 දරණ කාර්මික ආරවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමඟ කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරවුල් පනතේ 4 (1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරවුල බේරුම් කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්, කොළඹ, බම්බල පිටිය (Upper Floor) හේග් පාරේ අංක 43 හි එස්. එච්. පිලිපයිය මහතා මෙයින් යොමුකරනු ලැබේ.

එම්. පී. ද ඉසෙඩ් සිරිවර්ධන,
කම්කරු ඇමති.

1970 නොවැම්බර් මස 26 දින,
කොළඹ දී ය.

## ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) 131 වන අධිකාරිය—කාර්මික ආරවුල් පනත

එක්සත් ඉංජිනේරු කම්කරු සමිතිය
123, යූනියන් පෙදෙස,
කොළඹ 2,

සහ

වෝකර් සන්ස් ඇන්ඩ් කොම්පැණි ලිමිටඩ්,
තැ. පෙ. 166, කොළඹ,
අතර පවතින කාර්මික ආරවුලක් පිළිබඳවයි.

**ආරවුලට හේතුවී පවත්නා කාරණය පිළිබඳ ප්‍රකාශය**

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ආරවුලට හේතුවී ඇති කරුණ නම් :

වෝකර් සන්ස් ඇන්ඩ් කොම්පැණි ලිමිටඩ්හි පාලක පක්ෂය විසින් ඉහත සඳහන් සමිතියේ සාමාජිකයන්වන අමුණා ඇති උපලේඛනයේ නම් සඳහන් වන සේවකයන් සේවයෙන් පහකිරීම යුක්ති සහගතද, යන්නත් නොඑසේනම් ඔවුන් එකිනෙකාට කුමන සහන යන් හිමිද යන්නත් පිළිබඳව වේ.

1970 නොවැම්බර් මස 18 වැනිදා වූ මෙදින, කොළඹ, කම්කරු කොමසාරිස්ගේ කාර්යාලයේදී දින යොදන ලදී.

ඩබ්ලිව්. එල්. පී. ද මැල්,
කම්කරු කොමසාරිස්.

### උපලේඛනය

1. ඒ. ඩී. ජස්ටින්
2. බී. ඒ. ෆ්‍රැන්සිස්
3. ඒ. එම්. එම්. ෆාරුක්
4. අශෝකා පෙරේරා
5. එම්. අයියර්තේවාන්
6. එම්. එන්. සල්ගාදු
7. ඩී. එස්. බන්දුසේන
8. එන්. අබේදාස
9. ඩී. පී. ජිනදාස
10. කේ. එච්. සිල්වා
11. එස්. ඩී. එම්. ස්මායිල්
12. එස්. එල්. ගුණවර්ධන
13. එස්. කනගරත්නම්
14. එස්. මාසිලාමනි
15. ඩී. ඩබ්ලිව්. නෙල්සන්
16. මොහමඩ් රියාල්
17. එම්. එෆ්. එම්. බාකිර්
18. ජේ. ඒ. එස්. විමලවීර
19. රංජිත් ප්‍රනාන්දු
20. එස්. එම්. ක්‍රිසිටස්
21. පී. එස්. එල්. ඩයස්
22. විල්මට් සෝමසිරි
23. එම්. ඩී. පියදාස
24. ආම්ජඩීන්
25. පී. ඒ. ගෝමස්
26. එස්. හෙට්ටිආරච්චි
27. එම්. එස්. තාජුඩීන්
28. එෆ්. ද අල්විස්
29. වී. යෝගරත්නම්
30. ඩබ්ලිව්. එස්. හෙට්ටියවත්ත
31. කේ. ඩී. එච්. සුනිල් චන්ද්‍ර
32. ඩී. බී. ආනන්ද
33. කේ. පී. පියසේන
34. ආර්. ත්‍යාගනාදන්
35. බී. එල්. පැටර්නොට්
36. ඒ. ඊ. ප්‍රනාන්දු

37. එස්. සෙනෙවිරත්න
38. එල්. ආර්. ෆ්‍රැන්සිස්
39. ශාන්තිලාල් ප්‍රනාන්දු
40. එම්. දානියෙල්
41. එම්. හෙක්ටර් පෙරේරා
42. එල්. එස්. මාරික්
43. එස්. ජයසේන
44. ඊ. හරුන්
45. බී. ගුණසේන
46. සී. විතානගේ
47. එස්. පී. කරෝලිස්
48. එම්. කේ. චන්ද්‍රසේන
49. ඩී. එල්. ඩී. අතුකෝරලේ
50. කේ. එම්. ඇබ්දුල් හමීඩ්
51. ඩබ්. ඒ. එල්. එම්. උපසේන
52. කේ. ආරියපාල
53. කේ. ඩබ්. චන්ද්‍රපාල
54. ඒ. හෙට්ටිආරච්චි
55. මයිකල් කොක්
56. එච්. ජී. පියදාස
57. ඉඩින් ද මෙලෝ
58. එල්. පී. පුංචිසිංඤෝ
59. ජේ. ජෙගරින්
60. ඊ. සත්‍යදාස
61. කේ. ඊබට් පීරිස්
62. නිහාල් ප්‍රනාන්දු
63. ඩබ්. එම්. අමරසේකර
64. අර්ඩ්ලි වැන්ඩස්
65. නිහාල් බස්නායක
66. සිසිල් ප්‍රනාන්දු
67. දානියෙල් ජනාන්දු
68. ජී. එච්. පීටර්
69. එච්. ඩබ්. එම්. සිරිසේන
70. එච්. ආර්. ඩී. සිල්වා
71. ජී. ඩී. එම්. පෙරේරා
72. ඩී. එම්. ද සරනපාල
73. එස්. එම්. ජේව්
74. ඩී. ඩබ්ලිව්. චන්ද්‍රසේන
75. ජී. එම්. ඉන්දුමි
76. ඒ. දුනිවන් සිල්වා
77. රංජිත් සිල්වා
78. ඇල්ෆ්‍රඩ්.

12-290

---

අංකය : සී/අයි. 632.

## ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡෙදය, (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරවුල් පනත

### 4 (1) වන වගන්තිය යටතේ නියෝගයයි

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස්වරයාගේ ප්‍රකාශනයේ නියමිත කර දක්වා ඇති කාරණය පිළිබඳව එක්සත් තේ, රබර් සහ මෙරට ද්‍රව්‍ය කම්කරු සමිතිය, 71, මැලේ වීදිය කොළඹ 2, හා විල්ෆ්‍රඩ් ඇන්ඩ් කොම්පැණි ලිමිටඩ්, 198, ශාන්ත ජෝශප් වීදිය, කොළඹ 14, අතර කාර්මික ආරවුලක් පවතින හෙයින් ද,

කම්කරු ඇමති තැන්පත් මයිකල් පෝල් ද සොයිසා සිරිවර්ධන වන මම, 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරණ කාර්මික ආරවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡෙදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය වන කාර්මික ආරවුල් පනතේ 4(1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරවුල බේරුම් කිරීමෙන් සමථයකට පත්කිරීම සඳහා බේරුම්කරු වශයෙන් කොළඹ 6, බල පොකුණ පාරේ, අංක 15 හී—බී. එච් එම්. අමරසේකර මහතාට මෙයින් යොමුකරනු ලැබේ.

එම්. පී. ද ඉසෙඩ්. සිරිවර්ධන,
කම්කරු ඇමති.

1970 නොවැම්බර් මස 26 දින,

## ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) 131 වන අධිකාරිය—කාර්මික ආරවුල් පනත

එක්සත් තේ, රබර් සහ මෙරට ද්‍රව්‍ය කම්කරු සමිතිය,
71, මැලේ වීදිය,
කොළඹ 2,

සහ

විල්ෆ්‍රඩ් ඇන්ඩ් කොම්පැණි ලිමිටඩ්,
198, ශාන්ත ජෝශප් වීදිය,
කොළඹ 14,

අතර පවතින කාර්මික ආරවුලක් පිළිබඳවයි.

### ආරවුලට හේතුවී පවත්නා කාරණය පිළිබඳ ප්‍රකාශය

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ආරවුලට හේතුවී ඇති කරුණ නම්,

ඉහත සඳහන් සමිතියේ සාමාජිකයන්වන පහත නම් සඳහන් සේවකයින්ගේ සේවය විල්ෆ්‍රඩ් ඇන්ඩ් කොම්පැණි ලිමිටඩ් පාලක පක්ෂය විසින් අහෝසිකිරීම යුක්ති සහගතද යන්නත් ඔවුන් එකිනෙකාට කුමන සහනයක් හිමිද යන්නත් වේ:—

1. ඩබ්ලිව්. එස්. අබේවික්‍රම,
2. ඩබ්. එම්. මාග්‍රට්,
3. ඊ. ඩී. සොමිනෝනා,
4. එච්. ඒ. එම්. පෙරේරා,
5. ආර්. එංගලතිනාහාමි,
6. ජී. මාග්‍රට්,
7. එම්. සුමනාවතී,
8. ඩබ්. රොසයිරෝ,
9. මාග්‍රට් එච්. පෙරේරා,
10. වී. එස්. පෙරේරා,
11. ඩී. ඒ. අබේසිංහ,
12. ටී. පී. සිරියාවතී,
13. බී. මියුලින් නෝනා,
14. එච්. ඒ. ලිලිනෝනා,
15. ඒ. ඒ. ලිලිනෝනා.

1970 නොවැම්බර් මස 18 වැනිදා වූ මෙදින, කොළඹ කම්කරු කොමසාරිස්ගේ කාර්යාලයේදී දින යොදන ලදී.

ඩබ්ලිව්. එල්. පී. ද මැල්,
කම්කරු කොමසාරිස්.

12-291

---

# විවිධ දෙපාර්තමේන්තු දන්වීම්

## ජාත්‍යන්තර අධ්‍යාපන වර්ෂය 1970 සැමරීම සඳහා විශේෂ මුද්දර නිකුත් කිරීම

ජාත්‍යන්තර අධ්‍යාපන වර්ෂය 1970 සැමරීම සඳහා 1970 දෙසැම්බර් මස 21 වෙනි දින, ශත 15 වටිනාකමින් යුත් විශේෂ මුද්දර නිකුත් කරනු ලබන බව මහජනයාගේ දැනගැනීම සඳහා මෙයින් නිවේදනය කරනු ලැබේ. මෙම මුද්දර 1971 ජූනි 30 දින තෙක් හෝ තොග අවසානය වන දිනය යන මේ දෙදිනෙන් පළමුව එළඹෙන දිනය දක්වා අලෙවිය සඳහා තබනු ලැබේ. මෙම කාලය තුළදී දැනට අලෙවියෙහි පවත්නා කාණ්ඩයේ ශත 15 වටිනා කමින් යුත් මුද්දර අලෙවි කිරීම අත්හිටුවනු ලැබේ.

2. ශත 15 මුද්දරයෙන් දක්වෙන පුස්කොළපොතෙන්, බුද්ධ වර්ෂ 455 සිට 467 දක්වා වූ වර්ෂ වලදී ත්‍රිපිටකය (බුදුරජාණන් වහන්සේගේ ධර්මය අන්තර්ගත පාලි පොත්) ග්‍රන්ථාරූඪ කිරීම පිළිබඳ වූ වැදගත් අධ්‍යාපනික සිද්ධියක් නිරූපනය කරයි. සම කේන්ද්‍රික චක්‍ර ඉරිවලින් විදාමෙන් ලංකෘත මිනිස් හිසක ස්වරූපයක් පිළිබිඹු වේ.

ස. සිට්ටම්පලම්,
දේශීය ආදායම් කොමසාරිස්

දේශීය ආදායම් දෙපාර්තමේන්තුව,
කොළඹ 1,
1970 දෙසැම්බර් 3.

12-418

---

✓

ණය අංක 2201/3313

## ලංකාවේ කෘෂිකම් සහ කර්මාන්ත ණය සංස්ථාව

### 402 අධිකාරය වන කෘෂිකම් සහ කර්මාන්ත යන කර්මාන්ත ණය සංස්ථා ආඥාපනතේ 71 වන වගන්තිය යටතේ යෝජනාව

1970 අප්‍රේල් මස 2 වැනි දින ලංකාවේ කෘෂිකර්ම සහ කර්මාන්ත ණය සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පහත සඳහන් යෝජනාව ඒකමතිව සම්මත කොටගත් බව මෙයින් නිවේදනය කරනු ලැබේ:—

"ලංකාවේ කෘෂිකම් සහ කර්මාන්ත ණය සංස්ථාව නමින් ප්‍රසිද්ධ නොතාරිස් සී. ඒ. සී. රත්නායක විසින් සහතික කරණ ලද අංක 3,412 සහ 60.6.21 දින දරණ බැඳුම්කරය සහ ප්‍රසිද්ධ නොතාරිස් අයි. ඒ. බී. ඉහලගම විසින් සහතික කරන ලද අංක 9,723 සහ 67.12.1 දින දරණ බැඳුම්කරය යටතේ සාලුගුනු ගෙවීම් කුරුණෑගල දිස්ත්‍රික්කයේ, වාරියපොල, යාපල්ලම්ඩ් වතුයායෙහි පදිංචි ජෝකිනු සේරම් රොබට් විසින් පැහැර හැර ඇති බැවින් ද, එකී බැඳුම්කර යටතේ රුපියල් හතලිස් හතරදාස් එකසිය තිස් එකයි ශත දහයක (රු. 44,131.10) සමස්ත මුදලක් දැනට එම සංස්ථාවට අයවිය යුතුව හා ගෙවිය යුතුව ඇති හෙයින් ද, එකී මුදලත් මුල් මුදලේ ශේෂය වන අංක 3,412 දරන බැඳුම්කරය යටතේ රු. 24,966.43 ට, අංක 9,723 දරණ බැඳුම්කරය යටතේ රු. 17,500 ට, අවුරුද්දට සියයට 5½ සහ 7½ බැගින් පිළිවෙලින් 70.2.24 සහ 70.3.1 දින සිට මෙම විකුණුම් දිනය දක්වා වූ කාලය වෙනුවෙන් අයවිය යුතු වැඩි පුර පොලියත්, විකිණීම් ගාස්තුත් අයකර ගැනීම සඳහා ප්‍රසිද්ධ නොතාරිස්වරු වන සී. ඒ. සී. රත්නායක සහ අයි. ඒ. බී. ඉහලගම විසින් සහතික කරන ලද 60.6.21 දින අංක 3,412 සහ 67.12.1 දින අංක 9,723 දරණ බැඳුම්කර යටතේ එකී සංස්ථාවට උකස් කරන

ලද්දාවූ, (1) කුරුණෑගල දිස්ත්‍රික්කයේ, මැහිඇල්ලේ පිහිටි බලය ලත් මිනින්දෝරු ජී. ඒ. ද සිල්වා විසින් සාදස් කරන ලද අංක 5,018 සහ 50.5.26 දින දරණ ප්ලෑන ප්‍රකාර අ. 1, රූ. 0, ප. 32ක ප්‍රමාණයෙන් යුත්, කුරුණෑගල දිස්ත්‍රික් ඉඩම් කාර්යාලයේ ඒ 737/69 හි ලියාපදිංචිවී ඇති, ලැම්බර්ට්වත්තේ ලොට් 12 දරණ කැබැල්ල සහ එහි තුළ පිහිටි සියළු ගොඩනැගිලි, (2) ඉහතකී මැහිඇල්ලේ පිහිටි එකී ප්ලෑන ප්‍රකාර අ. 0, රූ. 2, ප. 18 ක ප්‍රමාණයෙන් යුත්, ඒ 737/70හි ලියාපදිංචිවී ඇති, ලැම්බර්ට්වත්තේ ලොට් 13 දරණ කැබැල්ල සහ එහි තුළ ඇති සියළු දේ, (3) ඉහතකී මැහිඇල්ල ගමේ පිහිටි එකී ප්ලෑන ප්‍රකාර අ. 0, රූ. 2, ප. 9 ක ප්‍රමාණයෙන් යුත්, ඒ 737/71හි ලියාපදිංචිවී ඇති, ලැම්බර්ට්වත්තේ ලොට් 14 දරණ කැබැල්ල සහ එහි තුළ පිහිටි සියළු දේ, (4) එකී මැහිඇල්ල ගමේ පිහිටි ඉහතකී ප්ලෑන ප්‍රකාර අ. 0, රූ. 1, ප. 17ක ප්‍රමාණයෙන් යුත්, ඒ 737/72හි ලියාපදිංචිවී ඇති, ලැම්බර්ට්වත්තේ ලොට් 17 දරණ කැබැල්ල සහ එහි තුළ පිහිටි සියළු දේ (5) එකී මිල්ලව ගමේ පිහිටි ඉහතකී ප්ලෑන ප්‍රකාර අ. 0, රූ. 1, ප. 27ක ප්‍රමාණයෙන් යුත්, ඒ 737/73හි ලියාපදිංචිවී ඇති, ලැම්බර්ට්වත්තේ ලොට් 31 දරණ කැබැල්ල සහ එහි තුළ පිහිටි සියළුදේ, (6) එකී මිල්ලව ගමේ පිහිටි ඉහතකී ප්ලෑන ප්‍රකාර අ. 0, රූ. 1, ප. 25ක ප්‍රමාණයෙන් යුත්, ඒ 737/74හි ලියාපදිංචිවී ඇති, ලැම්බර්ට්වත්තේ ලොට් 32 දරණ කැබැල්ල සහ එහි තුළ පිහිටි සියළුදේ, (7) එකී මිල්ලව ගමේ පිහිටි ඉහතකී ප්ලෑන ප්‍රකාර අ. 0, රූ. 2, ප. 24ක ප්‍රමාණයෙන් යුත්, ඒ 737/75 හි ලියාපදිංචිවී ඇති, ලැම්බර්ට්වත්තේ ලොට් 33 දරණ කැබැල්ල සහ එහි තුළ පිහිටි සියළුදේ සහ (8) එකී මිල්ලව පිහිටි, ඉහතකී ප්ලෑන ප්‍රකාර අ. 0, රූ. 1, ප. 16ක ප්‍රමාණයෙන් යුත් ඒ 737/76හි ලියාපදිංචිවී ඇති, ලැම්බර්ට්වත්තේ ලොට් 35 දරණ කැබැල්ල සහ එහි තුළ පිහිටි සියළුදේ යන නමින් හඳුන්වනු ලබන්නාවූ දේපල සහ ඉඩම කුරුණෑගල බලයලත් වෙන්දේසිකාර ලෝරන්ස් ඇෆ්. නානායක්කාර විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට (ලංකා නීති ප්‍රඥප්ති සංග්‍රහයේ 1956 ප්‍රතිශෝධිත මුද්‍රණයේ 402 වැනි අධිකාරය වන) ලංකාවේ කෘෂිකර්ම සහ කර්මාන්ත ණය සංස්ථාව පිළිබඳ ආඥාපනතින් තමන් වෙත පැවරී ඇති බලතල යටතේ ලංකාවේ කෘෂිකර්ම සහ කර්මාන්ත ණය සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙයින් තීරණය කරනු ලැබේ".

ජී. සැ. පො. ගුණවර්ධන,
සාමාන්‍යාධිකාරී.

1970 නොවැම්බර් 23 වැනි දින,
කොළඹ 3, ගාලු පාරේ අංක 292 දරණ ස්ථානයේදීය.

12-361

---

## විවාහ සිදු කිරීම සඳහා දේවස්ථානය ලියාපදිංචි කිරීම

විවාහ ලියාපදිංචි කිරීමේ ආඥාපනතේ (112 වැනි පරිච්ඡේදය) 10 වැනි වගන්තියේ විධිවිධාන අනුව ෂහුල් හමීඩ් මොහමඩ් සුබෙර් ෆාරුක් නමැති, ලංකාවේ රෙජිස්ට්‍රාර් ජනරාල් වන මම ප්‍රසිද්ධ ක්‍රිස්තියානි දේවස්ථානයක් හැටියට ප්‍රයෝජනයට ගැනෙන පහත සඳහන් කරනු ලබන ගොඩනැගිල්ල විවාහ සිදු කිරීම සඳහා විධිවූ පරිදි ලියාපදිංචි කර තිබෙන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

| අංකය | ලියාපදිංචි කිරීමේ දිනය | විස්තරය | පිහිටීම | දේවගැතිතැන, අයිතිකරු හෝ භාරකරු | ගොඩනැගිල්ල ලියාපදිංචි කරනු ලැබ ඇත්තේ කුමන ආගමක් වෙනුවෙන්ද |
|---|---|---|---|---|---|
| 986 ... | 29.11.70 ... | සාන්ත මිඛායෙල් අග්‍ර දූතයාණන් වහන්සේගේ දේවස්ථානය | සේරුකැලේ දෙමළ හත්පත්තුව කෝරළේ, පුත්තලම් දිස්ත්‍රික්කය | ගරු පීටර් නොලෙස්කො සුවාරිස් | රෝමානු කතෝලික |

හමීඩ් ෆාරුක්,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

රෙජිස්ට්‍රාර් ජනරාල්ගේ කාර්යාලය,
කොළඹ, 1970 නොවැම්බර් මස 29 වැනි දින.

12–331

## ගැසට් පත්‍රය පළකිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය සාමාන්‍යයෙන් සිකුරාද දිනවල පළකරනු ලැබේ. සිකුරාද දිනයක් ආණ්ඩුවේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාද දිනයට ප්‍රථම වැඩකරන දිනයේ ගැසට් පත්‍රය පළ කරනු ලැබේ. ඒ අනුව ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා නිවේදන බාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන ප්‍රසිද්ධ නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දින සහ වේලාවන් පහත පළකර ඇති උපලේඛනයේ දක්වේ. පහත සඳහන් නියමිත වේලාවන්ට පසුව ලැබෙන සියළුම දැන්වීම් එය එවූ අය වෙත තැපැලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ ගැසට් පත්‍රයේ එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් උවමනා ගැසට් පත්‍රයට දැන්වීම් ඇතුලත් වනවාත් හැර එය සියළුදෙනාගේ පහසුවට ද හේතු වන බව සලකන්න.

ආණ්ඩුවේ ගැසට් පත්‍රය සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති දායක මුදල් භාර නොගනී. සියළුම දායක මුදල් කොළඹ මහලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත කෙළින්ම යැවිය යුතුයි.

### උපලේඛනය

**1970**

| මාසය | පළ කිරීමේ දිනය | ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දිනය හා වේලාව | | |
|---|---|---|---|---|
| ජූනි | 70. 6. 5 සිකුරාද | 70. 5.29 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70. 6.11 බ්‍රහස්පතින්ද | 70. 6. 5 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70. 6.18 බ්‍රහස්පතින්ද | 70. 6.11 බ්‍රහස්පතින්ද | දහවල් | 12.0 |
| | 70. 6.25 බ්‍රහස්පතින්ද | 70. 6.18 බ්‍රහස්පතින්ද | දහවල් | 12.0 |
| ජූලි | 70. 7. 2 බ්‍රහස්පතින්ද | 70. 6.25 බ්‍රහස්පතින්ද | දහවල් | 12.0 |
| | 70. 7.10 සිකුරාද | 70. 7. 2 බ්‍රහස්පතින්ද | දහවල් | 12.0 |
| | 70. 7.17 සිකුරාද | 70. 7.10 සිකුරාද | දහවල් | 12.0 |
| | 70. 7.24 සිකුරාද | 70. 7.17 සිකුරාද | දහවල් | 12.0 |
| | 70. 7.31 සිකුරාද | 70. 7.24 සිකුරාද | දහවල් | 12.0 |
| අගෝස්තු | 70. 8. 7 සිකුරාද | 70. 7.30 බ්‍රහස්පතින්ද | ප.ව. | 3.30 |
| | 70. 8.14 සිකුරාද | 70. 8. 7 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70. 8.21 සිකුරාද | 70. 8.14 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70. 8.28 සිකුරාද | 70. 8.21 සිකුරාද | ප.ව. | 3.30 |
| සැප්තැම්බර් | 70. 9. 4 සිකුරාද | 70. 8.28 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70. 9.11 සිකුරාද | 70. 9. 4 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70. 9.18 සිකුරාද | 70. 9.11 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70. 9.25 සිකුරාද | 70. 9.18 සිකුරාද | ප.ව. | 3.30 |
| ඔක්තෝබර් | 70.10. 2 සිකුරාද | 70. 9.25 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70.10. 9 සිකුරාද | 70.10. 2 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70.10.16 සිකුරාද | 70.10. 9 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70.10.23 සිකුරාද | 70.10.16 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70.10.30 සිකුරාද | 70.10.23 සිකුරාද | ප.ව. | 3.30 |
| නොවැම්බර් | 70.11. 5 බ්‍රහස්පතින්ද | 70.10.30 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70.11.12 බ්‍රහස්පතින්ද | 70.11. 5 බ්‍රහස්පතින්ද | දහවල් | 12.0 |
| | 70.11.20 සිකුරාද | 70.11.12 බ්‍රහස්පතින්ද | දහවල් | 12.0 |
| | 70.11.27 සිකුරාද | 70.11.20 සිකුරාද | දහවල් | 12.0 |
| දෙසැම්බර් | 70.12. 4 සිකුරාද | 70.11.27 සිකුරාද | දහවල් | 12.0 |
| | 70.12.11 සිකුරාද | 70.12. 4 සිකුරාද | දහවල් | 12.0 |
| | 70.12.18 සිකුරාද | 70.12.10 බ්‍රහස්පතින්ද | ප.ව. | 3.30 |
| | 70 .1224 බ්‍රහස්පතින්ද | 70.12.17 බ්‍රහස්පතින්ද | ප.ව. | 3.30 |
| | 70.12.31 බ්‍රහස්පතින්ද | 70.12.24 බ්‍රහස්පතින්ද | ප.ව. | 3.30 |

එල්. ඩබ්ලිව්. ඩී. පීරිස්,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

1970 ජූනි 2 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව, කොළඹ.

ලංකාණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රිතයයි